

# කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
# கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு
# Ministry of Agriculture and Plantation Industries

## වැවිලි කර්මාන්ත අංශය
## பெருந்தோட்டக் கைத்தொழில் பிரிவு
## Plantation Industries Division

# 2023
# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# කාර්යසාධන වාර්තාව 2023

## කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### වැවිලි කර්මාන්ත අංශය




**කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (වැවිලි කර්මාන්ත අංශය)**

11 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල

දුරකථන - 011 - 2186160

ෆැක්ස් - 011 - 2186076

වෙබ් අඩවිය - http://www.plantationindustries.gov.lk

**සැකසුම : සැලසුම් අංශය**

දුරකථන - 011- 2187070 (අධ්‍යක්ෂ ජනරාල්)

ෆැක්ස් - 011- 2187075

විද්‍යුත් තැපැල් ලිපිනය - mpiplanningdiv@gmail.com



ගරු කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය
**මහින්ද අමරවීර මැතිතුමා**



ගරු වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය
**ලොහාන් රත්වත්තේ මැතිතුමා**



කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්
**ජානක ධර්මකීර්ති මහතා**

# අන්තර්ගතය


01 පරිච්ඡේදය — ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 පරිච්ඡේදය — ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය — 2023 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

04 පරිච්ඡේදය — කාර්යසාධන දර්ශක

05 පරිච්ඡේදය — තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

06 පරිච්ඡේදය — මානව සම්පත් පැතිකඩ

07 පරිච්ඡේදය — අනුකූලතා වාර්තාව

# 01. පරිච්ඡේදය

## 1. ආයතනික පැතිකඩ

### 1.1 හැඳින්වීම

රටේ සමස්ත ආර්ථික ව්‍යුහයේ වැදගත් අංශයක් වන වැවිලි බෝග සංවර්ධනය උදෙසා අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම නිරන්තරව ඉටු කරනු ලබන කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැවිලි කර්මාන්ත අංශය 2023 වර්ෂයේ දී ද, රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගතව තේ, පොල්, රබර් වැනි ප්‍රධාන වැවිලි බෝග ද තල්, කිතුල් සහ කජු වැනි සෙසු වැවිලි බෝග ද කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි, කොකෝවා, කෝපි, කරදමුංගු, සාදික්කා, වසාවාසි, බුලත්, පුවක්, පැඟිරි, ඉඟුරු, කහ, වැනිලා, සේර සහ ගොරකා ආදී සුළු අපනයන බෝගවල සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය රාජ්‍ය මෙහෙවර නිරන්තරව ඉටු කරනු ලැබීය. වැවිලි ක්ෂේත්‍රය රටේ වැදගත් ආර්ථික අංශයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වයක් ලබාදෙමින් ජනගහනයෙන් 10% ක පමණ පිරිසකට සෘජු සහ වක්‍ර රැකියා ද, ලබා දේ.

2022 මැයි 27 දිනැති අංක 2281/41 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ද, 2022 ජූලි 22 දිනැති අංක 2289/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ඉදිරිපත් කළ තහවුරු කිරීම අනුව ද, පෙර රාජ්‍ය අමාත්‍යාංශ තුනට පවරා තිබූ කාර්යයන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරා දෙනු ලැබුණි. එසේ වුවද, 2023 ඔක්තෝබර් 23 දිනැති 2355/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පෙර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා පෙර තිබූ කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය ඒකාබද්ධ කොට කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලෙස නම් කර කාර්යයන් පවරා ඇත.

මෑත කාලයේදී ශ්‍රී ලංකා ආර්ථිකය දැඩි අභියෝගවලට මුහුණ දෙමින් කටයුතු කරන අතර, වැවිලි ක්ෂේත්‍රය ද එම අභියෝගයන්ට මුහුණ දෙමින් 2023 වර්ෂයේ ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. වාර්ෂිකව වැවිලි ක්ෂේත්‍රය තුළින් උපයාගත් විදෙස් විනිමය ප්‍රමාණය ඩොලර් මිලියන 3,000- 4,000 ක සාමාන්‍ය අගයක් ගෙන ඇත.

පෙර වර්ෂයේ මෙන්ම 2023 වර්ෂයේ ද අමාත්‍යාංශයේ වැවිලි කර්මාන්ත අංශය තුළින් රාජ්‍ය වියදම් කළමනාකරණය කරගනිමින් වැවිලි ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් අදාළ ගැසට් පත්‍ර මඟින් පවරා ඇති කාර්යයන් අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී. එහිදී සියළු බෝග සඳහා වන සහනාධාර අවම කර පර්යේෂණ පහසුකම් වැඩිකර අගය එකතු කළ නිෂ්පාදන සඳහා ඉහළ අවධානයක් යොමු කරමින් තාක්ෂණයට අවශ්‍ය මඟ පෙන්වමින් ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණයන් ලබා දෙමින් අපනයන ආදායම ඉහළ නැංවීම කෙරෙහි අවධානයක් යොමු කරන ලදී.

ඉහත සඳහන් කළ සියළු කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පෙර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලෙසත් පසුව කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැවිලි කර්මාන්ත අංශය ලෙසත්, අනුබද්ධ ආයතන සමඟින් සැලසුම්ගත වැඩපිළිවෙලකට අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් 2023 වර්ෂයේ ළඟාකරගත් කාර්යසාධනය පිළිබඳව තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු (වැවිලි කර්මාන්ත අංශය)

### දැක්ම

**" වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මඟින් ජාතික සෞභාග්‍යය උදා කිරීම "**

### මෙහෙවර

**"ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් තහවුරු වූ වැවිලි කර්මාන්තයේ ඵලදායීතාව, ලාභදායීතාව සහ තිරසාරත්වය ඉහළ නැංවීම "**

### අරමුණු

- **සුවිශේෂී ජාත්‍යන්තර වෙළෙඳපොළ ඛණ්ඩ ජයගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත, ඉහළ අගය එකතු කිරීමක් සහිතව වැවිලි භෝග සංවර්ධනය**
- **රටට උපයන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ නැංවීම**
- **වගාකරුවාගේ ආදායම උසස් මට්ටමකට ගෙන ඒම**

## 1.3 ප්‍රධාන කාර්යයන්


**වර්ෂ 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කාර්යයන්**

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වැවිලි කර්මාන්ත විෂයයට සහ එම ගැසට් පත්‍රය මඟින් දක්වා ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහළ නැංවීම.
- ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉලක්ක කරගත් වැවිලි භෝග මත පදනම්ව වූ අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධ කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- තේ, රබර් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු.
- තේ, රබර් හා පොල් වතු කැබලි කර ජනාවාස ඉදිකිරීම උපරිම වශයෙන් සීමා කිරීම.
- වැවිලි භෝග කර්මාන්ත සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන් දිරි ගැන්වීම තුළින් රබර් නිෂ්පාදන කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සුලබ කිරීම.
- තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම.
- ග්‍රාමීය තේ වගාව ප්‍රවර්ධනය හා කුඩා තේ වතු හිමියන් දිරි ගැන්වීම.
- තේ අපනයනය සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා තේ සඳහා ජාත්‍යන්තර තේ වෙළඳපොල පුළුල් කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් ද ඇතුළත්ව ආශ්‍රිත භෝග වගා කටයුතු වර්ධනය කිරීම.
- දේශිය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම.
- වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.
- තේ, රබර් හා පොල් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම.
- කුඩා වැවිලි භෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

- පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධව වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම.
- නවීන තාක්ෂණය ද භාවිතා කරමින් දේශීය නිෂ්පාදනවල අගය එකතු කිරීම තුළින්, ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අපනයන වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම.
- සුළු වැවිලි බෝග කර්මාන්ත සුරක්ෂිතතාවය ඇති කරමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයින් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා පියවර ගැනීම.
- කුඩා වැවිලි බෝග වගා කටයුතු සඳහා ගුණාත්මකභාවයෙන් යුත් බීජ හා පැළ මඟින් ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සහනාධාර සහ අනෙකුත් පහසුකම් සැලසීම.
- අගය එකතු කළ නිෂ්පාදන ද ඇතුළුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- කුරුඳු, ගම්මිරිස් වැනි දේශීය බෝග වර්ග ප්‍රතිඅපනයනය වෙනුවට ශ්‍රී ලංකා සන්නාමය සහිතව අපනයන වෙළඳපොළ සඳහා දියුණු කිරීම, වසා දමා ඇති සීනි කර්මාන්තශාලා ආරම්භ කිරීම.
- උක් වගාව සඳහා අවශ්‍ය ජලය අරපිරිමැස්මෙන් භාවිතය සඳහා තාක්ෂණය මුසු වූ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- කුඩා වැවිලි භෝග සඳහා අපනයන ගම්මාන පිහිටුවීම.
- පොල්, කිතුල් හා තල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ ඊට අදාළ පර්යේෂණයන්ට අදාළ කටයුතු.
- දේශීය පොල් ඉල්ලුම සපුරාලීමටත් පොල්, තැඹිලි, කුරුම්බා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහාත් ක්‍රමෝපායන් සැකසීම.
- බහු බෝග වගාවන් සහ සංගත ගොවිපොළ ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම.
- භූගෝලීය සාධක සැළකිල්ලට ගෙන අධිඵලදාවක් සහිත පොල් පැළ ප්‍රභේද හඳුන්වා දීම.
- දේශීය සහ විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින්, නව තාක්ෂණය ද, මුසු වූ අගය එකතු කළ පොල්, කිතුල් හා තල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

ඊට අමතරව වර්ෂ 2023 ඔක්තෝබර් මස 23 දිනැති අංක 2355/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ඉහත සඳහන් කාර්යයන් අතරින් "වසා දමා ඇති සීනි කර්මාන්තශාලා ආරම්භ කිරීම, උක් වගාව සඳහා අවශ්‍ය ජලය අරපිරිමැස්මෙන් භාවිතය සඳහා තාක්ෂණය මුසු වූ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම" යන කාර්යයන් ඉවත්කර ඇත.

## 1.4 සංවිධාන සටහන



## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

- ❖ අමාත්‍ය කාර්යාලය
- ❖ ලේකම් කාර්යාලය
- ❖ පාලන අංශය
- ❖ සැලසුම් අංශය
- ❖ ගිණුම් අංශය
- ❖ සංවර්ධන අංශ
- ❖ ප්‍රතිපත්ති හා මෙහෙයුම් අංශය
- ❖ අභ්‍යන්තර විගණන අංශය

## 1.6 අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

වර්ෂ 2022 ජූලි 22 දිනැති අංක 2289 / 43 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

1. ශ්‍රී ලංකා තේ මණ්ඩලය *
2. තේ පර්යේෂණ ආයතනය *
3. තේ රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය
4. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
5. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
6. තේ ශක්ති අරමුදල
7. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය *
8. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය *
9. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව
10. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
11. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව *
12. රබර් පර්යේෂණ ආයතනය *
13. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
14. තුරුසවිය අරමුදල *
15. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව *
16. ශ්‍රී ලංකා කජු සංස්ථාව *
17. උක් පර්යේෂණ ආයතනය *
18. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය *
19. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
20. සීමාසහිත හලාවත වැවිලි සමාගම
21. පොල් වගාකිරීමේ මණ්ඩලය *
22. පොල් සංවර්ධන අධිකාරිය *
23. පොල් පර්යේෂණ ආයතනය *
24. තල් සංවර්ධන මණ්ඩලය *
25. කිතුල් සංවර්ධන මණ්ඩලය *
26. කප්රුක අරමුදල *
27. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
28. කන්තලේ සීනි සමාගම
29. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
30. සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම

* භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබන ආයතන

වර්ෂ 2023 ඔක්තෝබර් මස 23 දිනැති අංක 2355/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් හා වර්ෂ 2023 ඔක්තෝබර් මස 23 දිනැති අංක 2355/9 දරන අති විශේෂ ගැසට්පත්‍ර මඟින් ඉහත අංක 4,5,9,10,17,19,20,27,28,29,30 දරන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ඉවත් වී ඇත.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

| කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) | |
|---|---|
| ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය | ඇ. ඩො. මිලියන 65.401<br>රු.මිලි. 9,401 |
| ව්‍යාපෘති ආරම්භක දිනය | 2016.04.26 |
| ව්‍යාපෘති කාල සීමාව | අවුරුදු 06කි. (2016 - 2022)<br>ව්‍යාපෘති කාල සීමාව 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර ඇත |
| අරමුදල් දායකත්වය | අන්තර්ජාතික කෘෂිකර්මය සඳහා වන අරමුදල (IFAD),<br>ශ්‍රී ලංකා රජය |

❖ **කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

➢ **මූල්‍ය ප්‍රගතිය**

| සංරචක | 2023 වර්ෂයේ වෙන්කල ප්‍රතිපාදන (රු.මි) | 2023 වර්ෂයේ ප්‍රගතිය (රු.මි) | සමස්ත ප්‍රගතිය (රු.මි) |
|---|---|---|---|
| විදෙස් අරමුදල් (IFAD) | 1,617.23 | 1,587.66 | 5,507.72 |
| දෙශීය අරමුදල් (GOSL) | 274.97 | 253.97 | 2,211.17 |
| **එකතුව** | **1,892.20** | **1,841.63** | **7,718.89** |

➢ **භෞතික ප්‍රගතිය**

| වැඩසටහන් | 2023 වර්ෂයේ ප්‍රගතිය | සමස්ත ප්‍රගතිය |
|---|---|---|
| තේ නැවත වගාව (හෙක්.) | 1,724.73 | 3,725.38 |
| රබර් නව වගාව (හෙක්.) | - | 2,770 |
| ණය ලබාදුන් ප්‍රතිලාභීන් | 641 | 1623 |

| කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP)<br>සංරචක 1 : අගයදාම සංවර්ධනය | |
|---|---|
| ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය | ඇ.ඩො. මිලියන 48.62<br>රු.මිලි. 15,801.5 |
| ව්‍යාපෘති ආරම්භක දිනය | 2017.03.17 |
| ව්‍යාපෘති කාල සීමාව | අවුරුදු 07කි. (2017-2024)<br>ව්‍යාපෘති කාල සීමාව 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇත. |
| අරමුදල් දායකත්වය | ලෝක බැංකුව / ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) |

❖ **කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතියේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය**


| 2023 වර්ෂයේ වෙන්කල ප්‍රතිපාදන (රු.මි) | මූල්‍ය ප්‍රගතිය | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | 2023 වර්ෂයේ ප්‍රගතිය (රු.මි) | සමස්ත ප්‍රගතිය (රු.මි) | 2023 වර්ෂයේ ප්‍රගතිය | සමස්ත ප්‍රගතිය |
| 4,000.00 | 1275.70 | 8,946.90 | 76% | 71.6% |

# 02. පරිච්ඡේදය

## 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත් වලට අනුකූලව වැවිලි කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා ජාතික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කොටගෙන 2024-2027 වර්ෂයන්හිදී පහත සඳහන් ඉලක්ක ලඟාකරගැනීමට අපේක්ෂිතය .

## 2.1 වැවිලි ක්ෂේත්‍රයේ අපනයන ආදායම් ඉලක්ක (ඇ.ඩො.මිලි.)






## භෝග අනුව අපනයන ආදායම් ඉපයීම් හා ඉලක්ක

| වැවිලි භෝගය | 2023 | | | | 2024 | | 2025 | | 2026 | | 2027 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්ක | | සත්‍ය | | ඉලක්ක | | ඉලක්ක | | ඉලක්ක | | ඉලක්ක | |
| | රු.මිලි. | US$ මිලි. | රු.මිලි. | US$ මිලි. | රු.මිලි. | US$ මිලි. | රු.මිලි. | US$ මිලි. | රු.මිලි. | US$ මිලි. | රු.මිලි. | US$ මිලි. |
| තේ | 390,000.00 | 1,300.00 | 428,290.00 | 1,300.00 | 471,120.00 | 1440.00 | 518,230.00 | 1580.00 | 570,050.00 | 1740.00 | 627,060.00 | 1910.00 |
| රබර් | 310,000.00 | 958.00 | 304,770.00 | 930.00 | 320,000.00 | 989.00 | 340,000.00 | 1,072.00 | 360,000.00 | 1,136.00 | 370,000.00 | 1,167.00 |
| පොල් | 230,000.00 | 710.00 | 228,720.00 | 700.00 | 275,000.00 | 852.00 | 330,000.00 | 1,022.00 | 379,000.00 | 1,175.00 | 436,000.00 | 1,352.00 |
| කිතුල් | 275.00 | 0.867 | 312.00 | 0.958 | 425.00 | 1.31 | 500.00 | 1.54 | - | - | - | - |
| තල් | 40.00 | 0.108 | 57.00 | 0.183 | 62.00 | 0.193 | 67.00 | 0.209 | 72.00 | 0.225 | 77.00 | 0.240 |
| කජු | 1,364.00 | 4.33 | 311.00 | 0.99 | 400.00 | 1.27 | 440.00 | 1.40 | 520.00 | 1.65 | 600.00 | 1.90 |
| කුරුඳු | 83,294.10 | 266.97 | 70,063.92 | 214.06 | 80,000.00 | 250 | 85,000.00 | 300.00 | 95,000.00 | 325.00 | 100,000.00 | 350.00 |
| ගම්මිරිස් | 26,854.12 | 86.07 | 32,393.54 | 99.37 | 29,713.00 | 95.23 | 32,335.49 | 103.64 | 35,283.36 | 113.09 | 38,471.42 | 123.31 |
| කරාබු නැටි | 7,021.62 | 22.51 | 14,993.34 | 44.09 | 7,528.52 | 24.13 | 8,069.11 | 25.86 | 8,650.88 | 27.73 | 9,277.19 | 29.73 |
| කොකෝවා | 1,929.41 | 6.18 | 5,649.86 | 17.28 | 2,126.30 | 6.82 | 2,338.05 | 7.49 | 2,635.00 | 8.45 | 2,886.13 | 9.25 |
| කෝපි | 188.65 | 0.60 | 145.83 | 0.44 | 205.88 | 0.66 | 224.51 | 0.72 | 253.76 | 0.81 | 288.67 | 0.93 |
| කරදමුංගු | 64.49 | 0.21 | 495.30 | 1.53 | 81.72 | 0.26 | 100.67 | 0.32 | 121.83 | 0.39 | 145.52 | 0.47 |
| සාදික්කා | 4,957.65 | 15.89 | 5,723.90 | 17.63 | 5,232.04 | 16.77 | 5,530.74 | 17.73 | 5,915.73 | 18.96 | 6,336.87 | 20.31 |
| වසාවාසි | 1,741.54 | 5.58 | 2,086.88 | 6.52 | 1,837.92 | 5.89 | 1,942.85 | 6.23 | 2,078.09 | 6.66 | 2,226.03 | 7.13 |
| බුලත් | 5,498.38 | 17.62 | 4,856.70 | 14.77 | 5,809.09 | 18.62 | 6,137.12 | 19.67 | 6,510.91 | 20.87 | 6,906.88 | 22.14 |
| පුවක් | 23,429.84 | 75.10 | 19,686.13 | 62.06 | 25,876.60 | 82.94 | 28,615.14 | 91.72 | 31,675.40 | 101.52 | 35,090.01 | 112.47 |
| පැඟිරි | 253.00 | 0.81 | 6.49 | 0.02 | 266.02 | 0.85 | 279.71 | 0.90 | 367.89 | 1.18 | 464.83 | 1.49 |
| ඉඟුරු | 1,857.42 | 5.95 | 341.39 | 1.02 | 1,978.43 | 6.34 | 2,211.89 | 7.09 | 2,465.85 | 7.90 | 2,611.33 | 8.37 |
| කහ | 2,374.66 | 7.61 | 262.40 | 0.81 | 2,728.53 | 8.75 | 3,121.55 | 10.00 | 3,300.56 | 10.58 | 3,489.67 | 11.18 |
| වැනිලා | 69.68 | 0.22 | 457.97 | 1.42 | 93.32 | 0.30 | 123.27 | 0.40 | 160.52 | 0.51 | 210.00 | 0.67 |
| ජේර | 80.71 | 0.26 | 39.53 | 0.12 | 89.74 | 0.29 | 99.46 | 0.32 | 134.55 | 0.43 | 200.14 | 0.64 |
| ගොරකා | 274.87 | 0.88 | 220.19 | 0.67 | 289.30 | 0.93 | 304.49 | 0.98 | 321.23 | 1.03 | 339.68 | 1.09 |
| අපනයන ආදායම් මුළු එකතුව | **1,091,569.14** | **3,485.77** | **1,119,883.37** | **3,413.90** | **1,230,863.41** | **3802.55** | **1,365,671.05** | **4270.22** | **1,504,517.56** | **4697.98** | **1,642,681.37** | **5130.32** |

## 2.2 වැවිලි අංශයේ සමස්ත කාර්යසාධනය

### තේ ක්ෂේත්‍රය



| විස්තරය | වර්ෂ 2022 | වර්ෂ 2023 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2024 | 2025 | 2026 |
| නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.) | 251.50 | 262.00 | 256.05 | 268.75 | 275.00 | 287.00 |
| අපනයන ආදායම (රු.මිලි.) | 411,054 | 390,000 | 428,291 | 471,119 | 518,230 | 570,053 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි) | 1,260 | 1,300 | 1,300 | 1,440 | 1,580 | 1,740 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) | 250.17 | 260.00 | 241.91 | 248.96 | 266.68 | 277.69 |

### රබර් ක්ෂේත්‍රය



| විස්තරය | වර්ෂ 2022 | වර්ෂ 2023 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2024 | 2025 | 2026 |
| නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි) | 71 | 73 | 64 | 76 | 78 | 80 |
| අපනයන ආදායම (රු.මි) | 327,277 | 310,000 | 304,770 | 320,000 | 340,000 | 360,000 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි) | 1,018 | 958 | 930 | 989 | 1,072 | 1,136 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි) | 81 | 85 | 72 | 80 | 85 | 90 |
| අපනයන ප්‍රමාණය (ඒකක) | 34,845,001 | 40,000,000 | 23,505,133 | 30,000,000 | 35,000,000 | 40,000,000 |

## පොල් ක්ෂේත්‍රය



| විස්තරය | වර්ෂ 2022 | වර්ෂ 2023 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2024 | 2025 | 2026 |
| පොල් පැළ නිෂ්පාදනය (පැළ මිලි.) | 5.18 | 1.011 | 1.047 | 3.205 | 2.709 | 2.714 |
| පොල් අස්වැන්න (ගෙඩි මිලි.) | 3,391 | 3,150 | 3,170 | 3,250 | 3,350 | - |
| අපනයන ආදායම (රු.මිලි.) | 262,934 | 230,000 | 228,720 | 275,000 | 330,000 | 379,000 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි.) | 817 | 710 | 700 | 852 | 1,022 | 1,175 |

## කිතුල් ක්ෂේත්‍රය




| විස්තරය | | වර්ෂ 2022 | වර්ෂ 2023 | | ඉලක්ක | |
|---|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | සත්‍ය | 2024 | 2025 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.) | කිතුල් පැණි | 68,323 | 77,375 | 86,816 | 105,000 | 124,000 |
| | කිතුල් හකුරු | 190,585 | 198,500 | 208,573 | 227,000 | 245,000 |
| අපනයන ආදායම (රු.මිලි.) | | 243 | 275 | 312 | 425 | 500 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි) | | 0.775 | 0.867 | 0.958 | 1.31 | 1.54 |

## තල් ක්ෂේත්‍රය

| විස්තරය | | වර්ෂ 2022 | වර්ෂ 2023 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | සත්‍ය | 2024 | 2025 | 2026 |
| තල් නිෂ්පාදන | හකුරු (මෙ.ටො.) | 68 | 75 | 61 | 65 | 70 | 75 |
| | තල් රා (ලීටර්) | 7,508,975 | 10,000,000 | 10,584,534 | 11,000,000 | 12,000,000 | 13,000,000 |
| | පල්ප (ලීටර් ) | 52,000 | 60,000 | 27,394 | 50,000 | 50,000 | 50,000 |
| | තල් අල (මෙ.ටො.) | 380 | 415 | 403 | 410 | 420 | 430 |
| | තල් කෙඳි (මෙ.ටො.) | 48 | 50 | 60 | 65 | 70 | 75 |
| | අත්කම් (රු.මිලි) | 42 | 50 | 51 | 55 | 60 | 65 |
| | පනාටු (මෙ.ටො.) | 7.2 | 10 | 7 | 10 | 12 | 13 |
| | තල් අරක්කු (මි.ලි 750 බෝතල්) | 250,000 | 400,000 | 281,894 | 300,000 | 350,000 | 400,000 |
| | දැව ආශ්‍රිත (නො.) | 11,800 | 10,000 | 8,064 | 7,000 | 6,000 | 5,000 |
| අපනයන ආදායම (රු.මිලි) | | 22 | 40 | 57 | 62 | 67 | 72 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි.) | | 0.059 | 0.108 | 0.18 | 0.19 | 0.21 | 0.22 |

## සුළු අපනයන භෝග ක්ෂේත්‍රය





## උක් ක්ෂේත්‍රය

| විස්තරය | වර්ෂ 2022 | වර්ෂ 2023 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2024 | 2025 | 2026 |
| වගා භූමි ප්‍රමාණය (හෙක්.) | 25,476 | 25,483 | 25,980 | 26,108 | 31,025 | 32,395 |
| අස්වැන්න (මෙ.ටො.) | 1,279,519 | 1,274,160 | 1,010,867 | 1,357,610 | 1,706,365 | 1,846,531 |

## කජු ක්ෂේත්‍රය

| විස්තරය | වර්ෂ 2022 | වර්ෂ 2023 | | ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | සත්‍ය | 2024 | 2025 | 2026 |
| නිෂ්පාදනය (මෙ.ටො.) | 14,730 | 22,749 | 36.28 | 26,999 | 30,040 | 35,080 |
| අපනයන ප්‍රමාණය (මෙ.ටො.) | 58,205 | 682 | 68.34 | 1,052 | 1,502 | 1,650 |
| අපනයන ආදායම (රු.මිලි.) | 231.28 | 1,364 | 311.08 | 400 | 440 | 520 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි) | 0.73 | 4.33 | 0.95 | 1.27 | 1.4 | 1.65 |

## වෙනත් සුළු අපනයන භෝග ක්ෂේත්‍රය

| භෝගය | භෝග නිෂ්පාදනය (මෙ.ටො) | | අපනයන ප්‍රමාණය (මෙ.ටො) | අපනයන ආදායම (රු.බිලි) | අපනයන ප්‍රමාණය (මෙ.ටො) | අපනයන ආදායම (රු.බිලි) |
|---|---|---|---|---|---|---|
| | 2022 | 2023 | 2022 | | 2023 | |
| කුරුඳු | 24,094 | 24,475 | 18,820.62 | 74.89 | 20,133.13 | 70.06 |
| ගම්මිරිස් | 24,029 | 24,618 | 11,765.85 | 28.65 | 14319.14 | 30.02 |
| කරාබු නැටි | 4,088 | 4,179 | 2,337.85 | 6.71 | 5,852.12 | 14.99 |
| කොකෝවා | 709 | 716 | 1,711.27 | 4.21 | 1,985.09 | 5.65 |
| කෝපි | 2,537 | 2,638 | 50.56 | 0.17 | 34.71 | 0.15 |
| කරදමුංගු | 140 | 141 | 3.64 | 0.15 | 8.19 | 0.49 |
| සාදික්කා | 2,878 | 2,902 | 2,041.65 | 5.42 | 2,386.21 | 5.72 |
| වසාවාසි | | | 305.71 | 1.80 | 396.12 | 2.09 |
| බුලත් | 13,466 | 13,886 | 3,908.05 | 5.03 | 3,555.89 | 4.86 |
| පුවක් | 24,323 | 24,733 | 16,977.71 | 21.19 | 14,051.38 | 19.69 |
| පැඟිරි | 29 | 29 | 2.15 | 0.02 | 0.75 | 0.01 |
| ඉඟුරු | 25,455 | 19,375 | 130.52 | 0.33 | 103.84 | 0.34 |
| කහ | 65,945 | 51,346 | 43.42 | 0.18 | 89.28 | 0.26 |
| වැනිලා | 45 | 70 | 1.11 | 0.05 | 6.20 | 0.46 |
| සේර | 8 | 8 | 2.71 | 0.02 | 4.09 | 0.04 |
| ගොරකා | 3,350 | 3,400 | 90.11 | 0.23 | 117.95 | 0.22 |

## 2.3 2023 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකරන ලද ක්‍රියාකාරකම්

**තේ ක්ෂේත්‍රය**

- තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා වැවිලි අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ විද්වත් කණ්ඩායමක් විසින් 2021-2025 වර්ෂය දක්වා සකස් කරන ලද පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම අනුව 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පූර්ණ අධීක්ෂණයෙන් ක්‍රියාත්මක හෙක්ටයාර 750ක ඍජු තේ වගා ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 750ක මූල්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අරමුදලින් ලබා දී ක්‍රියාත්මක කළ අතර එහි සම්බන්ධීකරණ හා නියාමන කටයුතු සිදු කිරීම.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය බ්‍රිස්ටල් විශ්ව විද්‍යාලය, බ්‍රිතාන්‍ය රාජකීය උද්‍යානය (කිව්) හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය අතර තේ ශාකවල ආන්තික පාරිසරික තත්ත්වවලට (නියං තත්ත්ව) ඔරොත්තු දීමේ හැකියාව හා එම ශාකවල ජල පරිභෝජන කාර්යක්ෂමතාව ඔප් නැංවීම සඳහා වන අවබෝධතා ගිවිසුමක් ක්‍රියාත්මක වන අතර, එම ව්‍යාපෘතියට අදාළ කටයුතු අධීක්ෂණය, සම්බන්ධීකරණය හා නියාමන කටයුතු සිදු කිරීම සහ 2023 වර්ෂයට අදාළව මුදල් ප්‍රතිපාදන ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ද සිදු කිරීම.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ස්විස් ෆෙඩරල් ජනරජයෙහි තාක්ෂණික ආයතනය ශාක පෝෂණය සඳහා වූ කෘෂිකර්ම විද්‍යා ආයතන කණ්ඩායම (ETH Zurich) හා පේරාදෙණිය කෘෂිකර්ම පීඨය අතර ශ්‍රී ලංකාවේ පරිණත තේ වගාවන්හී නයිට්‍රජන් උපයෝගීතාවයෙහි කාර්යක්ෂමතාව ඔප් නැංවීම සහ නයිට්‍රජන් ක්ෂය වීම අවම කිරීම සඳහා කාබනික වගාව යොදා ගැනීමේ ශක්‍යතාව නිර්ණය කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක වන අතර එම ව්‍යාපෘතියට අදාළ කටයුතු අධීක්ෂණය, සම්බන්ධීකරණය හා නියාමන කටයුතු සිදු කිරීම සහ 2023 වර්ෂයට අදාළව මුදල් ප්‍රතිපාදන ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ද සිදු කර ඇත.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ තැරැව්කරුවන් හරහා තේ කර්මාන්තශාලා වෙත සිය තේ දළු සපයන්නන් සඳහා 8% වාර්ෂික පොළී පදනම යටතේ පොහොර මිලදී ගැනීම වෙනුවෙන් කිලෝ ග්‍රෑමයකට රුපියල් 300.00 ක සහනදායී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වෙන් කර ඇති රුපියල් බිලියන 4.5ක මුදල් අදාල ගිවිසුම් අනුව අය කර ගැනීම සිදු කර ඇති අතර අවසාන මාස 03 අතර කාලය තුළ ලබා දුන් ණය මුදල්වල ඉතිරි මුදල් අය කර ගැනීමේ සම්බන්ධීකරණ හා නියාමන කටයුතු සිදු කිරීම.

- 2022 ප්‍රංශ තාක්ෂණික ආධාර යටතේ සිලෝන් ටී සඳහා භූගෝලීය තත්ත්ව දර්ශකය ලබා ගැනීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් කටයුතු ආරම්භ කෙරිණි. එම ව්‍යාපෘතිය 2023 වර්ෂයේදීත් ක්‍රියාත්මක වූ අතර, GI ව්‍යාපෘතියේ බාහිර පාලන ආයතනය ලෙස අමාත්‍යාංශය GI ව්‍යාපෘතියෙහි සමස්ත අධීක්ෂණය හා සොයා ගැනීමේ පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයෙන් නිළධාරීන් 07 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් පත් කරන ලද අතර එහි සම්බන්ධීකරණ හා නියාමන කටයුතු සිදු කර ඇත.

## රබර් ක්ෂේත්‍රය

- කුඩා රබර් වතු හිමියන් 6,000ක් සඳහා ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතිය (RIVER Project), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ප්‍රංශයේ Ksapa සමාගම සහ Michelin Lanka සමාගම ඒකාබද්ධ වී ප්‍රංශ රජයේ ප්‍රදානයක් ලෙස මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර සහ මැදගම යන රබර් සංවර්ධන ව්‍යාපෘති කලාප තුළ 2022 වසරේ සිට ක්‍රියාත්මක කරන අතර 2023 වසරේ සිට ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම.

- රබර් පර්යේෂණ ආයතනයේ ප්‍රධානත්වයෙන් තාක්ෂණික වශයෙන් විශේෂීකරණය වූ රබර් (Technically Specified Rubber- TSR) කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත් කර එහි තීරණ ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) යටතේ ඌව පළාතේ වගා කරන ලද නව රබර් වගා හෙක්ටයාර 3,000 ක් පදනම්කර සිදු කරනු ලබන කාබන් වෙළඳාම හා සම්බන්ධ ව්‍යාපෘතියේ (Voluntary Carbon Market) කාබන් අලෙවි කිරීම ඇතුළු ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශයේ කමිටුවක් ස්ථාපිත කර කමිටු නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකිරීම.

- අමාත්‍ය මණ්ඩල අංක අමප/22/2180/616/034 හා 2023.01.23 දිනැති තීරණ අනුව සී/ස රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව ඈවර කිරීමේ මූලික කටයුතු සිදු කිරීම.

- යුරෝපා සංගමයේ වන හානි රෙගුලාසි (EU Deforestation Regulations)වලට අනුකූලව රබර් නිෂ්පාදන සිදු කිරීම පිළිබඳ පුද්ගලික අංශය සහ රාජ්‍ය අංශය ඒකාබද්ධ කමිටුවක් පත්කර ඒ සඳහා අවශ්‍ය තීරණ ගෙන ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම

- අමාත්‍යාංශයෙහි විෂය පථයට අදාළව රබර් ක්ෂේත්‍රයෙහි සංවර්ධනය අරමුණුකර අනුබද්ධ ආයතනවල පනත් සංශෝධනය කිරීම ආරම්භකර ඇත. එ අනුව,
    - 1956 අංක 11 දරන රබර් පාලන පනත හා 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
    - 1956 අංක 11 දරන රබර් පාලන පනතින් ස්ථාපිත රබර් පාලන දෙපාර්තමේන්තුව යන ආයතනික නාමය වෙනුවට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතනික නාමය ඇතුළත් කිරීම සහ 1956 අංක 11 දරන රබර් පාලන පනතින් ස්ථාපිත රබර් පාලක යන තනතුර වෙනුවට අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාමය ඇතුළත් කිරීමට පනත සංශෝධනය කිරීමේ කටයුතු කිරීම.
    - රබර් නැවත වගා සහ නව වගා සහනාධාර පනතේ වාරික ගණන සංශෝධනය කිරීම යටතේ පනතට අදාළ නියෝග සංශෝධනයට කටයුතු කිරීම

- වෙළෙඳපොළ තුළ උද්ගතව පවතින රබර් මිල අඩුවීමේ ගැටළුව අවම කිරීම සඳහා 2022 වර්ෂයේ සිට අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කමිටු නිර්දේශ අනුව 2023 වර්ෂයේ දී කටයුතු කළ අතර, එම නිර්දේශ මතම ඇතිකළ මඟ පෙන්වීම් මිලක් (Guidance price) සකස් කර රබර් ක්ෂේත්‍රයට අදාළ ආයතනවල වෙබ් අඩවිවල 2023 වර්ෂයේ දී ද, ප්‍රකාශයට පත් කිරීම.

- රබර් වගාව ආශ්‍රිතව ව්‍යාප්ත වන රෝග, කලින් හඳුනා ගෙන එම රෝග මර්දනය /පාලනය සඳහා දීර්ඝ කාලීන වැඩසටහනක් සකස් කිරීම හා අපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

- ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායම (IRSG) සහ ස්වභාවික රබර් නිපදවන රටවල සංගමය (ANRPC) විසින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා සහභාගී වීම සහ ඒවායෙහි කටයුතු සඳහා සහයෝගය ලබා දීම.

## පොල්, කිතුල් හා තල් ක්ෂේත්‍ර

- සුදු මැස්සා කෘමි උවදුර සහ බ්‍රොන්ටිස්පා කෘමි උවදුර මර්දනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය හා මෙහෙයවීම.

- පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය හා පොල් සංවර්ධන අධිකාරිය යන ආයතන සමඟ එක්ව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටු වීමට අදාළ පියවර ගැනීම.

- කප්රුක ආයෝජන ණය ක්‍රමය සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සහාභාගී කර ගැනීමට අවශ්‍ය පියවර කප්රුක අරමුදල සමඟ හා එක්ව ගැනීම.

- පොල් මලේ කොටසකින් තෙලිදිය (sap) ලබා ගැනීම සම්බන්ධ නියමු ව්‍යාපෘතියක් පොල් පර්යේෂණ ආයතනය හා හලාවත වැවිලි සමාගම එක්ව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සිදු කිරීම.

- පොල් ගෙඩියක මිල හා සමුච්චිත ලක්ෂය (Breakeven Point) මත පදනම්ව පොල් මිල තීරණය කිරීම සඳහා දර්ශක මිලක් සැකසීමට අදාළ කටයුතු සිදු කිරීම.

- සෞදි අරාබි රජය මඟින් සිදු කිරීමට නියමිත Green Initiative 2021 සඳහා කොහු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමට අදාළ කටයුතුවලට පොල් සංවර්ධන අධිකාරිය සමඟ එක්ව අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- මාලදිවයින් රජයේ ඉල්ලීමකට අනුව එම රටෙහි පොල් වගාව දියුණු කිරීමට පොල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව අවශ්‍ය සහයෝගය ලබාදීමට කටයුතු සම්බන්ධීකරණය සිදු කිරීම.

- පොල් පර්යේෂණ ආයතනය, හෙරිටේජ් නැචුරල් සමාගම, ඇල්පිටිය වැවිලි සමාගම හා ලක් ඇග්‍රෝ ෆෘප් සොලුෂන් යන සමාගම් අතර අවබෝධතා ගිවිසුම් අත්සන් තැබීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- පොල් සංවර්ධන අධිකාරිය විසින් මේ වන විට පොදු HS Codes යටතේ භාවිතා කරනු ලබන පොල් ආශ්‍රිත නිෂ්පාදන 12ක් සඳහා වෙන් වෙන් වශයෙන් HS Code සකස් කිරීමට අදාළව නිර්දේශය වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යාම.

- කලපු ආශ්‍රිතව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය සඳහා පොල් ක්ෂේත්‍රයේ දායකත්වය කෙසේ ද, යන්න පිළිබඳව පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය සමඟ කටයුතු කිරීම.

- "ගෙදරට පොල් ගෙවත්තෙන්" සංකල්පයට අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ පොල් ව්‍යාපෘතිය සඳහා පොල් පැළ ලබාදීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- ආහාර සුරක්ෂිතතාව සඳහා ගෙවතු වගා ආශ්‍රිත පොල් වගාව නඩත්තු කිරීමට දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- පොල් පැළ අලෙවි කිරීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය තුළ අලෙවි අංශයක් පිහිටුවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදීම.

- පොල් සංවර්ධන පනතෙහි ප්‍රකාශිත රෙගුලාසි බලාත්මක කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය සමඟ අවශ්‍ය කටයුතු සිදුකිරීම.

- පොල් ක්ෂේත්‍රය යටතේ කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව සංවර්ධනය කිරීමට අදාළ යෝජිත මාර්ග සිතියම සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- පොල් පර්යේෂණ ආයතනය හා රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය සිදු කිරීම.

- කප්රුක අරමුදල "කප්රුක ඉසුර" ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනේ මූල්‍ය ආයතන සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සිදු කිරීම.

- ජාත්‍යන්තර පොල් දිනය පැවැත්වීම සහ ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර පොල් ප්‍රජාව (ICC) හා සම්බන්ධීකරණය කරමින් කටයුතු පවත්වා ගැනීම.

- පොල් කර්මාන්තය උදෙසා පොල් ලෙලි එක්රැස් කිරීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කිරීම.

- පොල් වෙන්දේසියේ නීති රීති සංශෝධනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- පොල් පර්යේෂණ ආයතනය හා සී.අයි.සී.ඇග්‍රෝ බිස්නස් පුද්ගලික සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට අදාළ කටයුතු සම්පාදනය කිරීම.

- චීන සමාගමක් විසින් සක්‍රීය කාබන් නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීමට ආයෝජනය කිරීම සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- මිරිස්ස සමුද්‍රීය කලාපය වනජීවී සමුද්‍රීය අභයභූමිය තුළ පොල් වගාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- තල් අරක්කු හා රා සඳහා ප්‍රමිතිගත තත්ත්ව සහතික මැන බැලීමේ යන්ත්‍රය සඳහා අවශ්‍ය මදර් බෝඩ් (Mother board) කොටස සිංගප්පූරුවේ පිහිටි PTB නම් ආයතනය විසින් නොමිලේ තල් සංවර්ධන මණ්ඩලයට ලබාදීමේ දී ඒ සඳහා රේගුව විසින් අයකර ගන්නා ලද බදු මුදල් නිදහස් කර එම යන්ත්‍ර කොටස් තල් සංවර්ධන මණ්ඩලය වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- තල් පර්යේෂණ ආයතනය සහ බංගලාදේශයේ පවතින කාන්තාවන් සඳහා වූ විශ්ව විද්‍යාලය සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුමට අදාළ නෛතික පසුබිම ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- පොල් ආශ්‍රිත කර්මාන්තය ආරක්ෂාව හා නියාමනයට ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග යන මැයෙන් ප්‍රධාන ඉලක්ක සපුරා ගැනීමේ කණ්ඩායම් (Target Achieving Groups) 06ක් පත් කර පහත පරිදි එක් එක් විශේෂිත වූ කාර්යයන් පැවරීම.

- දේශීය පොල්තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීම.
- ඉදිරි වර්ෂ 03 සඳහා පොල් කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් නිෂ්පාදන ඉලක්ක සහිත සැලැස්මක් සකස් කිරීම.
- පොල් මද ආශ්‍රිත කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී මුහුණපෑමට සිදුවන ගැටළු නිරාකරණය කිරීම.
- පිරිවැය හා සමුච්ඡිත ලක්ෂය මත තීරණය වන පරිදි සකස් කළ මිල දර්ශකයක් මත පොල් මිල තීරණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.
- තැඹිලි අපනයනය වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම.
- පොල් ඵලදාව ගණනය කිරීමේ ක්‍රමවේදය පරස්පර වීම සම්බන්ධ ගැටළුව නිරාකරණය කිරීම.

## සුළු අපනයන භෝග ක්ෂේත්‍රය

➢ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් පහත කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- අපනයන කෘෂි බෝග පැළ මිල සංශෝධනය පිළිබඳව අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පොදු මහජනතාව, රාජ්‍ය හා පෞද්ගලික ආයතන මඟින් අපනයන කෘෂි බෝග වගාවන් සඳහා පැළ ඉල්ලීම්, තාක්ෂණික සහාය ලබා ගැනීම් වැනි ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාලව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය කිරීම.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් විකාශනය කරනු ලැබූ 2023 ප්‍රධාන සන්නිවේදන වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අපනයන කෘෂි බෝග වගා හානිවීම සඳහා සහන ලබාදීමට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

➢ ශ්‍රී ලංකා කජු සංස්ථාව සම්බන්ධයෙන් සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා කජු වගා කිරීමේ හැකියාව පවතින ඉඩම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- කජු සංස්ථාව සතු ඉඩම් පෞද්ගලික අංශයට බදු දීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- කජු සංස්ථාවට අයත් වතුයායයන්හි අතුරු භෝග වගා කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් වගාව සඳහා නිදහස් කර ඇති කජු ප්‍රභේදවල අභිජනන අයිතිය ලබා ගැනීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- කජු පුහුලම් ආශ්‍රිත ඇල්කොහොල් නිෂ්පාදන ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- කජු සංස්ථාවේ 2019,2020 වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- 2023 වර්ෂයේ කජු ඵලදාව අඩුවීම හේතුවෙන් ලෙලි කජු ආනයනය කිරීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- කජු සංස්ථාව සතු කජු වතුයායන්හි වගා කිරීමට ඉතිරිව ඇති භූමිය උපාය මාර්ගිකව සංවර්ධන කිරීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- දීර්ඝ කාලීන බදු පදනම යටතේ ඉඩම් ලබාදීම, වාර්ෂික බදු මුදල් හා වාර මුදල් අය කිරීම සම්බන්ධයෙන් කජු සංස්ථාව හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

➢ ශ්‍රී ලංකා කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ නව අලෙවි ස්ථාන ස්ථාපිත කිරීම, කහ මිලදී ගැනීම, දේශීය කුළුබඩු මිලදී ගැනීම සහ සහතිකකරණයට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## 2.4 2024 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත ක්‍රියාකාරකම්

**තේ ක්ෂේත්‍රය**

- තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා සකස් කරන ලද පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මට අනුව තේ ක්ෂේත්‍රයේ සියලු ආයතනවලට අදාළ කටයුතු සඳහා අවශ්‍ය කටයුතු තවදුරටත් සම්බන්ධීකරණය හා නියාමන කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය (SLAEB) සමඟ එක්ව විවිධ කෘෂි පාරිසරික කලාපවල නිපදවන තේවල භෞතික හා රසායනික ප්‍රමිතීන් පිළිබඳ දත්ත පදනමක් සකස් කිරීම (Geographic Indication) තුළින් සිලෝන් ටී සන්නාමයන් තහවුරු කිරීම, ලංකා තේ සහ ප්‍රාදේශීය තේ සඳහා GI ලබා ගැනීම, සුපිරිසිදු සිලෝන් තේ සන්නාමය තහවුරු කිරීමට ආරම්භ කරන ලද ව්‍යාපෘතියට අදාළව ශ්‍රී ලංකාවේ එක් එක් තේ වගා කරන ප්‍රදේශ සඳහා භූ පාරිසරික කටයුතු පිළිබඳ ප්‍රගතිය සම්බන්ධීකරණය හා නියාමනය ඉදිරියටත් සිදු කිරීම.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය ස්විස් ෆෙඩරල් ජනරජයෙහි තාක්ෂණික ආයතනය, ශාක පෝෂණය සඳහා වූ කෘෂිකර්ම විද්‍යා ආයතන කණ්ඩායම (ETH Zurich) හා පේරාදෙණිය කෘෂිකර්ම පීඨය අතර ශ්‍රී ලංකාවේ පරිණත තේ වගාවන්හි නයිට්‍රජන් උපයෝගීතාවයෙහි කාර්යක්ෂමතාව ඔප් නැංවීම සහ නයිට්‍රජන් ක්ෂය වීම අවම කිරීම සඳහා කාබනික වගාව යොදා ගැනීමේ ශක්‍යතාව නිර්ණය කිරීම සඳහා වන ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු නියාමනය කිරීම.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය බ්‍රිස්ටල් විශ්ව විද්‍යාලය බ්‍රිතාන්‍ය රාජකීය උද්‍යානය (කිව්) හා පේරාදෙණිය කෘෂිකර්ම පීඨය අතර තේ ශාකවල ආන්තික පාරිසරික තත්ත්ව (නියං තත්ත්ව) වලට ඔරොත්තු දීමේ හැකියාව හා එම ශාක වල ජල පරිභෝජන කාර්යක්ෂමතාව ඔප් නැංවීම සඳහා වන ව්‍යාපෘතිය නියාමනය කිරීම.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය ක්‍රියාත්මක කරනු ලබන අමු තේ දළුවල ප්‍රමිතිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියට (B-60 ව්‍යාපෘතිය) අදාළ කටයුතු නියාමනය කිරීම.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය ක්‍රියාත්මක කරනු ලබනු සිලෝන් ටී සඳහා භූගෝලීය දර්ශක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය නියාමනය කිරීම.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය ක්‍රියාත්මක කරනු ලබනු ඉරානයට තෙල් සඳහා තේ මඟින් වූ ණය පියවීමේ යෝජනා ක්‍රමය සම්බන්ධීකරණ හා නියාමන කටයුතු කිරීම.

**රබර් ක්ෂේත්‍රය**

- දේශීය රබර් නිෂ්පාදනය මෙ.ටො.100,000 දක්වා ඉහළ නැංවීමේ අරමුණ සපුරාගැනීම සඳහා මොනරාගල, අම්පාර, බදුල්ල සහ වවුනියා දිස්ත්‍රික්කවල නව රබර් වගා හෙක්ටයාර 10,000 ක ඉලක්ක කර මුල් අදියර ලෙස 2024 වර්ෂයේ දී හෙක්ටයාර 1,100 ක නව රබර් වගාව ආරම්භ කිරීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි රබර් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරනු ලබන සමාගම් වෙත අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සපයා ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.

- අමාත්‍ය මණ්ඩල අංක අමප/22/2180/616/034 හා 2023/1/23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව ඈවර කිරීමේ කටයුතු සිදු කිරීම.

- කුඩා රබර් වතු හිමියන් 6,000ක් සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය (RIVER ව්‍යාපෘතිය) පවත්වා ගෙන යාම.

- යුරෝපා සංගමයේ වන හානි රෙගුලාසිවලට (The European Green Deal and the EU Deforestation-free Regulation (EUDR) අනුකූලව රබර් නිෂ්පාදන සිදු කිරීම පිළිබඳ පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් ද සාකච්ඡා කර අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.

- 1956 අංක 11 දරන රබර් පාලන පනත හා 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර පනත සංශෝධනය කිරීමට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම.

- රබර් නැවත වගා සහ නව වගා සහනාධාරයේ වාරික ගණන සංශෝධනය කිරීමට කටයුතු කිරීම.

- තිරසාර රබර් කර්මාන්තය උදෙසා නැගෙනහිර සහ ඌව පළාත්වල ස්ථාපනය කරන ලද නව රබර් වගාව ස්වේච්ඡා කාබන් වෙළෙඳපොළ වෙත යොමු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරමින් ක්‍රියාත්මක කිරීම.

- තුරුසවිය අරමුදල ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීම සහ 2000 අංක 23 දරන තුරුසවිය පනත අහෝසි කර එහි රාජකාරී කටයුතු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට සහ රබර් පර්යේෂණායතනයට පවරා දීමේදී නිසි නෛතික තත්ත්වයන් පනත් මඟින් සකස් කිරීම.

## පොල්, කිතුල් හා තල් ක්ෂේත්‍ර

- Ksapa ආයතනය පොල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව අතුරු වගාවක් ලෙස *Gliricidia* වගාව හා කුළුබඩු වගාව සඳහා අවශ්‍ය උපාය මාර්ග සම්බන්ධයෙන් වගාකරුවන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය පොල් පර්යේෂණ ආයතනය සමඟ ඒකාබද්ධව කටයුතු සිදු කිරීම.

- සෞදි අරාබි රජය මඟින් සිදු කිරීමට නියමිත Green Initiative 2021 සඳහා කොහු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමට අදාල කටයුතු වලට පොල් සංවර්ධන අධිකාරිය සමඟ එක්ව කටයුතු කිරීම.

- පොල් සංවර්ධන පනතෙහි ප්‍රකාශිත රෙගුලාසි බලාත්මක කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය සමඟ අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.

- පොල් ක්ෂේත්‍රය යටතේ කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව සංවර්ධනය කිරීමට අදාල යෝජිත මාර්ග සිතියම සකස් කිරීම.

- පොල් කර්මාන්තය උදෙසා පොල් ලෙලි එක්රැස් කිරීමේ නියමු ව්‍යාපෘතිය පොල් සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කිරීම.

- පොල් වෙන්දේසියේ නීති රීති සංශෝධනයට අදාල කටයුතු සම්බන්ධීකරණය සිදු කිරීම.

- සුදු මැස්සා සහ බ්‍රොන්ටිස්පා කෘමි උවදුර මර්දනය කිරීමේ ව්‍යාපෘති තවදුරටත් සම්බන්ධීකරණය හා මෙහෙයවීම.

- වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනය කර ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නැවත පොල් පැල සිටුවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සිදු කිරීම හා රෝගී ගස් ඉවත් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- තල් නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් සහ කර්මාන්තකරුවන් පුහුණු කිරීමට අවශ්‍ය මෙහෙයවීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- අපනයනකරුවන් සහ තල් සංවර්ධන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් තල් නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.
- තල් නිෂ්පාදන අලෙවිසල් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- කිතුල් ව්‍යවසායකයින් දේශීය වෙළඳපොළ සහ විදේශ වෙළඳපොළ වෙත යොමු කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- කිතුල් කර්මාන්තකරුවන් කිතුල් සංවර්ධන මණ්ඩලය මගින් ලියාපදිංචි කිරීම හා ඔවුන් සඳහා GMP හා SLS තත්ත්ව සහතික ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## සුළු අපනයන භෝග ක්ෂේත්‍රය

- දේශීය සන්නාමය ප්‍රවර්ධනය කිරීම සඳහා "Healing Island" නම් e පොතක් (E-Book) සකස් කිරීම.
- මීට පෙර වසරවල ස්ථාපනය කරන ලද අපනයන කෘෂි කලාපයන්ගේ ප්‍රගතිය විමර්ශනය කිරීම හා ඉදිරි අවශ්‍යතාවයන් හඳුනාගැනීම.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කජු සංස්ථාව, කුළුබඩු හා ඒ ආශ්‍රිත අලෙවි මණ්ඩලය යන ආයතන සම්බන්ධීකණය කිරීම.
- අපනයන කෘෂිකර්ම පනත සංශෝධනය හා ශ්‍රී ලංකා කජු සංස්ථාවට සහ කුළුබඩු හා ඒ ආශ්‍රිත අලෙවි මණ්ඩලයට පනත් සකස් කිරීම.
- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව මගින් වාර්ෂිකව පවත්වන ලද අන්තර්ජාතික සමුළුව 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට අදාල කටයුතු සම්බන්ධීකරණය.
- අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 15 ක් ක්‍රියාත්මක කිරීම.

## කුරුඳු ක්ෂේත්‍රය

- 2024 වර්ෂයේ කුරුඳු වගාවේ සංවර්ධනය උදෙසා පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
    - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා ආයතනය සමඟ වූ ව්‍යාපෘතිය කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීම සහ ඊට අදාල ගිවිසුම කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා ආයතනය සමඟ නැවත අත්සන් කිරීම.
    - ජාතික කුරුඳු කර්මාන්ත ආශ්‍රිත සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය ව්‍යාපෘතිය (Cinnamon Gate) ක්‍රියාත්මක කිරීම.
    - Market Access Protocol on Ceylon Cinnamon මගින් චීනයට කුරුඳු අපනයනය කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරීම.

## 2.5 අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද වෙනත් විශේෂ ක්‍රියාකාරකම්

➢ **විශේෂ සංවර්ධන ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.**

- වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘති යෝජනා 17ක් නිර්දේශයට යොමු කරන ලදී.

➢ **ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම**

- වැවිලි ක්ෂේත්‍රයට ප්‍රතිපාදන වෙන් වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මාසිකව යොමු කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය සඳහා වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ තීරණ හා ක්‍රියාකාරකම් සම්බන්ධව වාර්ෂිකව තොරතුරු හා දත්ත වාර්තා කිරීම.
- වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා මහා භාණ්ඩාගාරය වෙත හා වෙනත් ආයතන වෙත යොමු කිරීම.

➢ **අමාත්‍යාංශ ප්‍රකාශන සැකසීම**

- අමාත්‍යාංශ කාර්යසාධන වාර්තාව - 2022 සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කිරීම.
- අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව - 2023 සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කිරීම.
- වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ දත්ත ඇතුළත් සංඛ්‍යාලේඛන අත්පොත - 2021 සැකසීම.

➢ **ක්‍රියාත්මක සැලසුම් සැකසීම**

- 2023 අමාත්‍යාංශ ක්‍රියාත්මක සැලැස්ම හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම සැකසීම.
- අමාත්‍යාංශය සඳහා සෘජුව ප්‍රතිපාදන ලැබෙන සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාත්මක සැලසුම් හා සංශෝධිත ක්‍රියාත්මක සැලසුම් සැකසීම.
- අනුබද්ධ ආයතනවල ක්‍රියාත්මක සැලසුම් සමාලෝචනය හා ක්‍රියාත්මක ප්‍රගතිය පිළිබඳ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

➢ **විශේෂ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය**

- කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ (STaRR) ප්‍රගතිය සමාලෝචනය කිරිම.
- කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතියේ (ASMP) ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- අමාත්‍යාංශයට සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතීන්ට අදාළව ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- අමාත්‍යාංශයන්ට අනුබද්ධ ආයතනයන්හී ක්‍රියාත්මක සැලසුම් අනුව කාර්තුමය ප්‍රගතිය සමාලෝචනය කිරීම.

➢ **අභ්‍යන්තර විගණනයට අදාළව සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**

- අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සංඛ්‍යාව - 10
- අනුබද්ධ ආයතනයන් සම්බන්ධව සිදුකරන ලද විමර්ශන කටයුතු සංඛ්‍යාව - 16
- අනුබද්ධ ආයතනයන් සම්බන්ධව සිදු කරන ලද ක්ෂේත්‍ර සංඛ්‍යාව - 01

## අමාත්‍ය මණ්ඩල තීරණ හා ඊට අදාළ ප්‍රගතිය

| අනු අංකය | ගනු ලැබූ විශේෂ ප්‍රතිපත්තිමය තීරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01. | 2023.02.27 දිනැති අංක අමප/23/0225/616/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට අයත් ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාවේ යන්ත්‍ර සූත්‍ර නිසි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර අලෙවි කිරීම. | මෙම රබර් කර්මාන්තශාලාවේ සහ එහි යන්ත්‍ර සූත්‍ර වලට අදාළ තක්සේරු වාර්තාව 2023.07.26 දින ලැබුණු අතර, ඒ අනුව එම යන්ත්‍ර සූත්‍ර නිසි ප්‍රසම්පාදන මාර්ග අනුගමනය කර අලෙවි කිරීමට අදාල කටයුතු ආරම්භ කර ඇත. |
| 02. | 2023.08.09 දිනැති අංක අමප23/1501/601/050 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කුරුඳු සංවර්ධනය සඳහා නව දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම. | 2023.09.01 දින කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කළ අතර L.M.J.K. ලින්දර මහතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කරන ලදී. |
| 03. | 2023.10.09 දිනැති අංක 23/1911/616/044 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකාවේ කුරුඳු චීනයට අපනයනය සඳහා වන ශාක සනීපාරක්ෂක (Phytosanitory) අවශ්‍යතා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. | 2023.10.19 දින මහජන චීන සමූහාණ්ඩුවේ සාමාන්‍ය රේගු පාලනය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙනුවෙන් විදේශ අමාත්‍යතුමා අත්සන් කරන ලදී. |
| 04. | 2023.02.15 දිනැති අංක අමප/23/0288 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ කිරීම | ව්‍යාපෘති කාල සීමාව මාස 18කින් දීර්ඝ කිරීම |
| 05. | 2023.03.20 දිනැති අංක අමප/23/0456/616/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වැවිලි භෝග ආශ්‍රිත ජාත්‍යන්තර සංවිධාන 8ක සාමාජිකත්වය තවදුරටත් පවත්වාගෙන යාම | ජාත්‍යන්තර සංවිධාන 08හි සාමාජිකත්වය තවදුරටත් පවත්වාගෙන යාම හා එම සාමාජික රටවල හිඟ සාමාජික මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම |

## 2.6 තේ, රබර්, පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය මඟින් සිදුකරන ලද විශේෂ ක්‍රියාකාරකම්

❖ **අයදුම්පත් ලැබීම් සමස්ත සාරාංශය - 2023.12.31 දිනට**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ලැබුණු අයදුම්පත් ගණන | 670 |
| පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන | 18 |
| අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් | 572 |
| අධ්‍යක්ෂ මණ්ඩල මඟින් අනුමත කරන ලද අයදුම්පත් | 528 |
| ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් | 1 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ/ නීති උපදෙස්/වාර්තා ලබාගැනීමට තීරණය වූ අයදුම්පත් ගණන | 6 |
| පනතට අදාළ නොවන අයදුම්පත් | 37 |
| වාර්තා ලබාගැනීමට යොමු කර ඇති සහ අසම්පූර්ණ අයදුම්පත් | 96 |
| පැවරීමට අනවශ්‍ය බව දන්වන ලද අයදුම්පත් | 1 |

❖ **ඉඩමේ ස්වභාවය අනුව**

| ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | පවරනු ලබන ආකාරය | ඉල්ලුම් කළ ප්‍රමාණය | | | අනුමැතිය ලබාදුන් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අක්. | රූඩ්. | පර්. | අක්. | රූඩ්. | පර්. |
| 140 | තනි ඒකක | 1975 | 3 | 38.25 | 1904 | 0 | 30.25 |
| 100 | බැංකු උකස් | 2481 | 1 | 24.80 | 2443 | 1 | 16.8 |
| 430 | අනෙකුත් පැවරීම් | 6839 | 2 | 5.82 | 4674 | 0 | 22.47 |
| **670** | **එකතුව** | **11305** | **3** | **28.87** | **9021** | **2** | **29.52** |

❖ **දිස්ත්‍රික්ක අනුව**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 248 |
| පුත්තලම දිස්ත්‍රික්කය | 183 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 103 |
| ඉහත දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්ක | 136 |
| ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව | 670 |

❖ **භෝග අනුව**

| භෝග වර්ගය | අයදුම්පත් ගණන | භූමි ප්‍රමාණය (ඉල්ලුම් කරන ලද) | | |
|---|---|---|---|---|
| | | අක්. | රූඩ්. | පර්. |
| පොල් | 514 | 8488 | 0 | 31.31 |
| රබර් | 23 | 344 | 1 | 7.61 |
| තේ | 39 | 1276 | 3 | 37.71 |
| වෙනත් | 94 | 1196 | 1 | 32.24 |
| එකතුව | 670 | 11305 | 1 | 28.87 |

## 2.7 අනුබද්ධ ආයතනයන්හී වාර්ෂික වාර්තා අනුමත කිරීමේ ප්‍රගතිය

| අනු අංකය | ආයතනය | අවසන් වරට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව | වාර්ෂික වාර්තා සකස් කිරීම පිළිබඳ ප්‍රගතිය |
|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 2022 | - |
| 2. | තේ පර්යේෂණ ආයතනය | 2021 | 2022 වාර්ෂික වාර්තාවේ සංශෝධන සිදු කර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරන ලෙස තේ පර්යේෂණ ආයතනය වෙත දන්වා ඇත. |
| 3. | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 2022 | - |
| 4. | තේ ශක්ති අරමුදල | 2014 | 2015 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. 2016 වාර්ෂික වාර්තාව මේ වන විට සකස් කරමින් පවතී. |
| 5. | ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය | 2022 | - |
| 6. | තුරුසවිය අරමුදල | 2022 | - |
| 7. | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 2021 | 2022 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| 8. | ජාතික වැවිලි කළමණාකරණ ආයතනය | 2021 | 2022 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත. |
| 9. | පොල් සංවර්ධන අධිකාරිය | 2021 | 2022 වාර්ෂික වාර්තා කෙටුම්පත දෙවන වර පරික්ෂා කර අදාළ සංශෝධනයන් කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇත. |
| 10. | පොල් වගා කිරීමේ මණ්ඩලය | 2021 | 2022 වාර්ෂික වාර්තා කෙටුම්පත පළමුවර පරික්ෂා කර අදාළ සංශෝධනයන් කිරීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත යොමු කර ඇත. |
| 11. | පොල් පර්යේෂණායතනය | 2021 | 2022 සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කරමින් පවතී |
| 12. | තල් සංවර්ධන මණ්ඩලය | 2019 | 2020 වාර්ෂික වාර්තා කෙටුම්පත තෙවන වරටත් පරික්ෂා කරමින් පවතී. |
| 13. | කිතුල් සංවර්ධන මණ්ඩලය | - | 2021 වාර්ෂික වාර්තා කෙටුම්පත සංශෝධනය සඳහා කිතුල් සංවර්ධන මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. |
| 14. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2022 | - |
| 15. | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 2018 | 2019,2020,2021 සහ 2022 වාර්ෂික වාර්තා සකස් කරමින් පවතී. |

## 2.8 විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන්හී ප්‍රගතිය (2023.12.31 දිනට)

### අයවැය ඇස්තමේන්තු මඟින් සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

**තේ ක්ෂේත්‍රය**

| ව්‍යාපෘතිය | අනුමත ප්‍රතිපාදන (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය - ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය** | | | |
| දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන වැඩිදියුණු කළ බීජ නිපදවීමට බීජ උද්‍යාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය (2021-2025) | 0.90 | 0.90 | ▪ බීජ උද්‍යාන 11 ක නඩත්තු කටයුතු සිදු කිරීම<br>▪ නව පරිශ්‍රයක බීජ උද්‍යානයක් ස්ථාපිත කිරීමට බිම් සකස් කොට අවසන් කිරීම |
| ස්වයංක්‍රීය තේ දළු නෙලන යන්ත්‍ර හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (2021-2023) | 0.05 | 0.05 | ▪ පළමු මූලාකෘති 02 හි සංවර්ධන කටයුතු අවසන් කර ඇත. |
| තේ වගාවේ මව් වගාවන්හි (Mother Bush Area) වපසරිය වැඩි කිරීම (2022-2027) | 14.40 | 14.40 | ▪ හෙක්ටයාර 1.3 ක පැළ සිටුවීම<br>▪ පුනරුත්ථාපන තෘණ වගාකර ඇති බිම්වල නඩත්තු කටයුතු සිදු කිරීම<br>▪ පරිශ්‍ර 05 ක මව් වගා බිම් නඩත්තු කටයුතු සිදු කිරීම<br>▪ පරිශ්‍ර 05 ක මූලික තවාන් කටයුතු සිදු කිරීම |
| ශ්‍රී ලංකාවේ නව්‍ය තේ නිෂ්පාදකයන් පිළිබඳ මූලික අධ්‍යයනය - ගැටළු, අභියෝග සහ නව විභවතා (2023) | 1.80 | 1.80 | ▪ සම්පත් පුද්ගල සාකච්ඡා 06 ක් පැවැත්වීම<br>▪ සිද්ධි අධ්‍යයනය 20 ක් අවසන් කිරීම<br>▪ පරිගණක 01 ක් මිලදී ගැනීම<br>▪ වැඩමුළු 01 ක් පැවැත්වීම |
| රසායනාගාර විශ්ලේෂණය සඳහා තේ පර්යේෂණ ආයතනයේ අරමුදල් හිඟය පියවීම (2023) | 8.49 | 8.49 | ▪ විද්‍යාගාරය සඳහා රසායන ද්‍රව්‍ය (Chemicals) 65 ක් මිලදී ගැනීම<br>▪ UV Visible Spectrophotometer සඳහා අමතර කොටසක් මිලදී ගැනීම<br>▪ Atomic Absorption Spectrophotometer (AAS) හන්තාන අංශය වෙත මාරු කිරීම |
| **ක්‍රියාත්මක ආයතනය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය** | | | |
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පෙර වර්ෂයන්හි ඇතිකරගත් සහනාධාර බැඳීම්හි 2023 වර්ෂයේ වාරික ගෙවීම (2023) | 100.00 | 100.00 | ▪ නැවත වගාව හෙක්. 829<br>▪ අලුත් වගාව හෙක්. 30<br>▪ පාළු සිටුවීම පැළ 200,000 ක් සිදු කිරීම. |

## රබර් ක්ෂේත්‍රය

| ව්‍යාපෘතිය | අනුමත ප්‍රතිපාදන (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය - රබර් පර්යේෂණ ආයතනය** | | | |
| ආන්තික ප්‍රදේශවල තිරසාර රබර් වගාවක් සඳහා වියළි තත්ත්වවලට ඔරොත්තු දෙන ක්ලෝන පරීක්ෂා කිරීම (2021-2024) | 14.50 | 14.50 | ▪ මෙම වසරේ දෙවන රෝපණ ද්‍රව්‍ය කාණ්ඩය සඳහා අවශ්‍ය පැල සකස් කිරීම අවසන් විය. රෝපණ ද්‍රව්‍ය ශාක ගෘහය වෙත ගෙන එන ලද අතර, ජම්බෝ පොලි බෑග් වෙත මාරු කර පැල ස්ථාවර වීමට ඉඩ සලසන ලදී. ජලය හිඟ තත්වය ඇති කර කායික විද්‍යාත්මක ලක්ෂණ ප්‍රකාශ වීම විශ්ලේෂණය කිරීම සඳහා දත්ත ලබා ගැනීම ආරම්භ කරන ලදී. |
| පරිසර හිතකාමී ආර්ථිකමය සහනදායී, සෙමෙන් පොහොර මුදාහරින තාක්ෂණය ක්ෂේත්‍ර ස්ථාපනය මඟින් රබර් වගාවේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම හා රබර් කර්මාන්තය උදෙසා වූ විශ්ලේෂණ කර්මාන්තය වැඩි දියුණු කිරීම පිණිස රසායනාගාර පහසුකම් ජාත්‍යන්තර තත්ත්වයට පත්කිරීම. (2021-2023) | 27.29 | 27.29 | ▪ අයර් වතුයායේ නව පොහොර මිශ්‍රණයට (R/U 20:7:20) අදාළ පර්යේෂණ ක්ෂේත්‍ර පිහිටුවීම සිදු කරන ලදී. කොහුබත් පොහොර කැට 190,000ක් ප්‍රසම්පාදන කටයුතු හරහා මිලදී ගැනීම, විද්‍යාගාර උපකරණ සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්වලට අදාළ උපකරණ මිලදී ගැනීම් සිදු කරන ලදී. අත්පොත සහ ආකෘති පත්‍ර පිළියෙල කර ඇත. |
| නව පත්‍ර පතන රෝගයට අදාළ වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන්ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම. (2021-2025) | 13.74 | 13.74 | ▪ රබර් වවන දිස්ත්‍රික්කවලින් ලබා ගන්නා ලද ව්‍යාධිජනක රෝපිත 40ට අදාල ජානමය විශ්ලේෂණයක් සිදු කොට රෝග කාරකයා හඳුනාගෙන එම රෝපිත 4ක් සඳහා ඒවායේ බීජාණු නිපදවීම පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන ලදී.<br>▪ දේශගුණික සාධක රෝග ව්‍යාප්තිය කෙරෙහි වන බලපෑම සහ රෝග ව්‍යාප්තිය මඟින් අස්වැන්න කෙරෙහි වන බළපෑම පිළිබඳ තවදුරටත් අධ්‍යයන කටයුතු සිදු කෙරේ.<br>▪ ජීව විද්‍යාත්මක ක්‍රම දෙකක් අධ්‍යයනය කෙරේ. රෝගී පත්‍ර පුළුස්සා කොම්පෝස්ට් සෑදීමට භාවිතා කිරීමට හා |

| | | | |
|---|---|---|---|
| | | | රෝගයට ඔරොත්තු දෙන රබර් ක්ලෝන හඳුනා ගැනීමේ අධ්‍යයනයක් ද සිදු කෙරේ.<br>▪ රසායනාගාර පරීක්ෂණවලට අමතරව ක්ෂේත්‍ර මට්ටමින් ද, දිලීරනාශක යොදවා අධ්‍යයන කටයුතු කරමින් පවතී.<br>▪ අවසාන කාර්තුව සඳහා පුහුණු වැඩසටහන් 04ක් පවත්වා ඇත. |
| ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තශාලා වල අපසන්දන ජලය පිරිපහදු කිරීමේ ජනක අධීක්ෂණය කිරීම හා ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම (2021-2023) | 10.78 | 10.78 | ▪ අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කර ඇත.<br>▪ විද්‍යාත්මක උපකරණ සහ භාණ්ඩ මිලදී ගත් අතර විද්‍යාගාරයේ කටයුතු ආරම්භ කර ඇත.<br>▪ අපජලය පොහොරක් ලෙස භාවිත කල හැකි වන ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇති අතර කුඩා වතු හිමියන් 5දෙනෙකු තෝරාගෙන නියමු ව්‍යාපෘති සිදු කරන ලදී.<br>▪ මහාපරිමාණ පවිත්‍රාගාර වල කාර්යයන් සිදු කිරීම සඳහා වූ අත්පොතක් සකස් කර ඇත. |
| පෞද්ගලික අංශයේ ටයර් පරික්ෂාව සහ සංවර්ධන කටයුතු පහසු කරලීමේ ව්‍යාපෘතිය (2024) | 13.03 | 13.03 | ▪ යටිතල පහසුකම් සංවර්ධනය කර යන්ත්‍ර ස්ථාපිත කිරීම අවසන් කරන ලදී. රසායනාගාරයට අවශ්‍ය අමතර උපකරණ මිලදී ගත් අතර එම වැඩි දියුණු කල යටිතල පහසුකම් 2024 පෙබරවාරි මස මැද භාගයේ ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී. |
| මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්කයන් හී කුඩා රබර් වතුහිමියන්ගේ මූලික රබර් කිරි පරික්ෂා කිරීමේ කටයුතු සඳහා පවතින ගොඩනැගිල්ලක් රසායනාගාරයක් සකස් කිරීම වෙනුවෙන් අවශ්‍ය උපකරණ මිල දි ගැනීම. (2023) | 1.925 | 1.925 | ▪ විද්‍යාගාර උපකරණ සවිකිරීම සහ අළුත්වැඩියා කටයුතු සමඟ විද්‍යාගාරයේ සියළු වැඩ කටයුතු අවසන් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය - ශ්‍රී ලංකා රබර් ලේකම් කාර්යාලය** | | | |
| රබර් මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (2017-2026)<br><br>❖ රබර් වගාව නිර්දේශයානුකූලව සිදු කිරීම සඳහා සේවා සපයන්නන් හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතිය<br><br>❖ කළුතර දිස්ත්‍රික්කයේ දැනට අතහැර දමා ඇති රබර් ඉඩම්හී නැවත කිරි කැපීම ආරම්භ කිරීම සඳහා වන ව්‍යාපෘතිය<br><br>❖ කිරි කැපීම සඳහා NVQ සුදුසුකම්ලත් නිපුණතා සහිත කිරි කැපුම් ශිල්පීන් රබර් කර්මාන්තයට හඳුන්වාදීමේ ව්‍යාපෘතිය<br><br>❖ රබර් කාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා වන කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිය | 15.00 | 12.517 | ▪ නිර්දේශානුකූලව රබර් වගාවක් සිදු කිරීම සඳහා සේවා සපයන්නන් 49 ක් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් පුහුණුකර ක්ෂේත්‍රයට හඳුන්වා දී ඇත. එම පුහුණුවුවන් මඟින් කණ්ඩායම් 7 ක් සකස්කර රබර් වගාවට අවශ්‍ය ප්‍රමිතිගත සේවා සපයන්නන් ලෙස දැනටමත් ක්ෂේත්‍රය තුළ කටයුතු කරනු ලබයි.<br><br>▪ පුහුණු කරන ලද පුද්ගලයින් 64 ක් තෝරාගෙන අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා ඒ අවට හෙක්ටයාර 102ක අත්හැර දමා ඇති රබර් වගාව නැවත කිරි කැපීම සඳහා යොදවා ඇත.<br><br>▪ තෝරාගත් කිරි කැපුම් ශිල්පීන් 200 ක් අතරින් 169 ක් නිපුණතා ඇගයීම් පරීක්ෂණය සාර්ථකව නිම කර NVQ level 3 මට්ටමට සුදුසුකම් ලබාගෙන ඇත. තවත් 17 ක් අවම ඇගයීම් ඉලක්කයට ළගාවී ඇත. 12 දෙනෙක් ඇගයීම් සඳහා ඉදිරිපත් නොවූහ.<br><br>▪ කොළඹ, ගම්පහ, කළුතර හා ගාල්ල දිස්ත්‍රික්ක 4හි සම්මුඛ පරීක්ෂණ මඟින් සුදුසු කර්මාන්ත තෝරාගෙන අවශ්‍යතා විශ්ලේෂණය සිදුකර ඇත. |
| **ක්‍රියාත්මක ආයතනය - වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය** | | | |
| වතු ඉඩම්වල කැඩැස්තර මිනුම් කිරීමේ ව්‍යාපෘතිය (2024-2027) | 40.00 | 19.55 | ▪ 2022 වර්ෂයේ මැනුම් කටයුතු කරන ලද වතු 7 කට අදාල රු.මි 11.73 ක අතැති බිල්පත් ගෙවා අවසන් කර ඇත. ඉලක්ක කරන ලද වතු 4 ක මැනුම් කටයුතු අවසන් කර ඇත. ඒ අනුව වතු 11 ක මැනුම් කටයුතු අවසන් කිරීම වෙනුවෙන් ගෙවීම් කර ඇත. |

**පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන ක්ෂේත්‍රය**

| ව්‍යාපෘතිය | අනුමත ප්‍රතිපාදන (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය - පොල් පර්යේෂණ ආයතනය** | | | |
| නෙත් අතරමැදි කලාපයේ නව බීජ පොල් උයනක් ස්ථාපනය කිරීම. (2021-2023) | 10.0 | 10.0 | ▪ අත් පරාගණයෙන් බීජ පැළ 2000 ක් නිපදවීම.<br>▪ 2023 වසරේදී පැළ 1,871 ක් (අක්කර 29.2 ක්) මව් ශාක ලෙස සිටුවන ලදී.<br>▪ 2022/23 වසරවල සිටුවන ලද අක්කර 49.2 ක පැළ හොඳින් නඩත්තු කරන ලදී.<br>▪ විද්‍යාගාරය සඳහා අධි ශීතකරණයක් හා අන්වීක්ෂයක් මිලදී ගන්නා ලදී.<br>▪ ගැඹුරු ළිඳක් ඉදිකිරීමේ කටයුතු සිදුකර ඇත. |
| දෙමුහුම් බීජ නිෂ්පාදනය (කිනියම බීජ උද්‍යාන ව්‍යාපෘතිය) (2019-2023) | 5.5 | 5.5 | ▪ මව් ශාක 300ක අත්පරාගණ කටයුතු සිදුකර ඇත.<br>▪ පොල් පැළ 1,270ක් සිටුවන ලද අතර පළිබෝධ මර්දන කටයුතු සිදුකරන ලදී.<br>▪ ගැඹුරු ළිඳක් ස්ථාපනය කර අවසන් කර ඇති අතර ඒ සඳහා සූර්ය විදුලිය ලබා ගැනීමට කටයුතු කර ඇත.<br>▪ පාංශු ජල සංරක්ෂණය සඳහා පොල් ලෙලි වලවල් 500ක් සකසන ලදී. |
| පොල් පර්යේෂණ ආයතනයේ මධ්‍යම විශ්ලේෂණ විද්‍යාගාරය සහ පොල් පර්යේෂණ ආයතනයේ ජාන හා ශාක අභිජනන අංශයෙහි රසායනාගාර උපකරණ සඳහා ආයෝජනය කිරීමෙන් පොල් කර්මාන්තයේ පාර්ශවකරුවන්ට සහය සහ ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම. (2023) | 9.5 | 9.5 | ▪ සියළුම උපකරණ මිලදී ගැනීමට කටයුතු කර ඇත. (විද්‍යාගාර මේස, විද්‍යාගාර කේන්ද්‍රාපසාරණය, විද්‍යාගාර සාම්පල් ඇඹරුම් යන්ත්‍ර, වර්ණාවලීක්ෂය, ඉංජිනේරු ස්වයංක්‍රීය PH මීටරය, වායුසමන යන්ත්‍ර, විදුලි ආරක්ෂකය, වර්තනාංකය මනින උපකරණය, ඇඹරුම් යන්ත්‍ර, උෂ්ණත්වමානය, මයික්‍රෝ පිපෙටය, විද්‍යුත් පොල් ගෑමේ යන්ත්‍රය ) |
| **ක්‍රියාත්මක ආයතන - පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** | | | |
| වැලිගම පොල් කොළ මැලවීමේ රෝග මර්දන වැඩසටහන (2019-2025) | 68.92 | 63.992 | ▪ රෝගී පොල් ගස් සලකුණු කිරීම - 10,560<br>▪ බලපෑමට ලක්වූ ග්‍රාම නිලධාරී වසම්වල රෝගී ගස් එන්නත් කිරීම - 6,623<br>▪ ඉවත් කරන ලද රෝගී ගස් සඳහා වන්දි ගෙවීම - 9,439 |

| | | | |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය - කිතුල් සංවර්ධන මණ්ඩලය** | | | |
| කිතුල් නිෂ්පාදන සඳහා දේශීය සහ විදේශිය වෙළෙඳපොල ප්‍රවර්ධනය කොට කිතුල් කර්මාන්තයේ නියුතු කිතුල් කාර්මිකයන්ගේ සහ කිතුල් නිෂ්පාදන අලෙවිකරණ ව්‍යාසායකයින්ගේ ආදායම් තත්ත්වය වැඩි කිරීම.<br>(2023) | 1.965 | 1.965 | ▪ "Kithul Ceylon" වෙළෙඳ සන්නාමය සහිත ලේබලයන් නිර්මාණය කිරීම.<br>▪ වෙළෙඳ ප්‍රදර්ශන 03 ක් සඳහා වෙළෙඳ කුටි ලබා දීම. (ජාත්‍යන්තර කර්මාන්ත ප්‍රදර්ශනය 2023 - කොළඹ, කර්මාන්ත ප්‍රදර්ශනය ගාල්ල සහ මහනුවර) කුළුබඩු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය සමඟ සම්බන්ධීකරණයෙන් ගුණාත්මක කිතුල් පැණි බෝතල් වෙළෙඳපොළට නිකුත් කිරීම.<br>▪ කිතුල් සහ කිතුල් නිෂ්පාදන පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් නිර්මාණය කිරීම. |
| කිතුල් නිෂ්පාදකයන් සංවිධාන ගත කිරීම, මානව කුසලතා සංවර්ධනය, සමාජීය වශයෙන් සවිබල ගන්වා ප්‍රජා පාදක ව්‍යාපාරික යාන්ත්‍රණයක් ගොඩනැගීම<br>(2023) | 3.93 | 3.93 | ▪ කොත්මලේ, යටිනුවර හා නෙළුව යන ප්‍රදේශවල පුහුණු වැඩමුළු 03ක් සම්පූර්ණ කර ඇත.<br>▪ කිතුල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය උපකරණ කට්ටල 25 ක් කාර්මික තාක්ෂණ ආයතනයෙන් (ITI) මිලදී ගෙන කොත්මලේ, යටිනුවර හා නෙළුව පුහුණු වැඩමුළු සඳහා සහභාගී වූ කර්මාන්තකරුවන් 25 අතර බෙදා හැරීම.<br>▪ යටියන්තොට මධ්‍යස්ථානයේ ආරක්ෂාව සඳහා දැල්වැට සකස් කර නිම කිරීම.<br>▪ වාණිජමය බෝගයක් ලෙස කිතුල් වගාව ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. |
| **ක්‍රියාත්මක ආයතනය - පොල් වගා කිරීමේ මණ්ඩලය** | | | |
| බ්‍රොන්ට්ස්පා කෘමි උවදුර පාලනය කිරීම<br>(2023) | 9.7 | 9.7 | ▪ රෝගී ගස් හඳුනාගැනීම හා සලකුණු කිරීම - 18,829<br>▪ එන්නත් කිරීම - 17,927<br>▪ විද්‍යාගාර පහසුකම් සඳහා ගොඩනැගිලි අලුත්වැඩියාව සම්පූරණ කර ඇත.<br>▪ දැනුවත් කිරීමේ වැඩසටහන් - 15 |
| උතුරු පළාත් පොල් ත්‍රිකෝණය පිහිටුවීමේ ව්‍යාපෘතියට අදාළ පොල් පැළ ප්‍රවාහනය.<br>(2023) | 9.5 | 9.5 | ▪ යාපනය, කිළිනොච්චිය, මුලතිවු, වව්නියාව හා මන්නාරම දිස්ත්‍රික්කවලට වගාකරුවන් වෙත ලබා දීමට පොල් පැළ ප්‍රවාහනය - 466,926<br>▪ ඉඩම් තෝරා ගැනීම - 3,068<br>▪ පොල් පැළ සිටුවීම 466,926 |

| | | | |
|---|---|---|---|
| ප්‍රදේශයට ආවේණික ඉහළ පොල් අස්වැන්නක් ලබාදෙන පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් මිල දී ගැනීම. (2023) | 9.8 | 9.8 | ▪ බීජ පොල් 115,000 ක් මිලදී ගැනීමේ කටයුතු සිදු කර ඇති අතර මෙමගින් පොල් පැළ 80,000 ක් නිපදවා උතුරු පළාතේ පොල් වැවීමේ කටයුතු සඳහා ලබා දෙනු ලැබේ. |
| දකුණු කුඩා පොල් ත්‍රිකෝණයෙහි පොල් ඉඩම් සංවර්ධනය සඳහා පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් මිලදී ගැනීම. (2023) | 8.0 | 8.0 | ▪ බීජ පොල් 89,090ක් මිලදී ගැනීමේ කටයුතු සිදු කර ඇති අතර මෙමගින් ලැබෙන පොල් පැළ 62,365ක් නිපදවා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගාකරුවන්ට ලබා දෙනු ලැබේ. |
| නාගරික ගෙවතු වගාවන්හි පොල් වගාව සඳහා ලබාදීමට පොල් පර්යේෂණ ආයතනයේ පොල් පැළ මිලදී ගැනීම. (2023) | 9.8 | 9.8 | ▪ පොල් පැළ (hybrid -Draft+ tall) 24,500 ක් මිලදී ගැනීමේ කටයුතු සිදු කර ඇති අතර, එම පොල් පැළ නාගරික ගෙවතු සඳහා ලබා දෙනු ලැබේ. |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ නැවත වගා හා යටි වගා වැඩසටහන් සඳහා පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය පොල් බීජ මිලදී ගැනීම. (2023) | 8.8 | 8.8 | ▪ බීජ පොල් 80,000ක් මිලදී ගැනීමේ කටයුතු සිදු කර ඇති අතර මෙමගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් නැවත හා යටි වගා වැඩසටහන සඳහා අවශ්‍ය පොල් පැළ 56,000 ක් නිපදවීමට කටයුතු කර ඇත. |
| **ක්‍රියාත්මක අංශය - රබර් හා පොල් සංවර්ධන අංශය** | | | |
| කප්රුක අරමුදල (2023) | 25.00 | 19.825 | ▪ පොල් ආශ්‍රිත කුඩා හා ක්ෂුද්‍ර ව්‍යවසායක ප්‍රවර්ධන වැඩසටහන යටතේ පුහුණු වැඩසටහන් 38ක් හා ප්‍රදර්ශන 6ක් පැවැත්වීම.<br>▪ කුඩා පොල් ඉඩම් හිමිකරුවන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ ඉඩම්වල ඵලදායීතාවය හා ආදායම් උත්පාදනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 24ක් පවත්වා ඇත.<br>▪ කප්රුක සමිති සවිබල ගැන්වීම සහ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා සමිති 438ක්, නව සමිති 78ක් හා ධාරිතා සංවර්ධන වැඩසටහන් 11ක්, ප්‍රගති සමාලෝචන රැස්වීම් 88ක් පැවැත්වීම. |

## සුළු අපනයන භෝග ක්ෂේත්‍රය

| ව්‍යාපෘතිය | අනුමත ප්‍රතිපාදන (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ සුළු අපනයන භෝග ප්‍රවර්ධන අංශය** | | | |
| අපනයන කෘෂි කලාප-ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා වන දිස්ත්‍රික් පාදක කුඩා වැවිලි බෝග සංවර්ධන වැඩසටහන (2021-2025) | 48.57 | 42.172 | ▪ දිස්ත්‍රික්ක 13ක් ආවරණය වන පරිදි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද ගොරකා, සාදික්කා, වැනිලා, එනසාල්, කරාබුනැටි සහ කෝපි යන බෝගයන්ගෙන් යුත් අපනයන කෘෂි කලාප 30ක් ස්ථාපිත කළ අතර, පහත පරිදි රෝපණ ද්‍රව්‍ය ලබා දී ඇත.<br>• සාදික්කා - 15,364<br>• කරාබුනැටි - 12,906<br>• එනසාල් - 49,520<br>• වැනිලා - 187,010<br>• ගොරකා - 7,619<br>• කෝපි (ඇරබිකා) - 125,238<br>▪ මාතලේ, අනුරාධපුරය, බදුල්ල, මොණරාගල, අම්පාර යන දිස්ත්‍රික්කවල පුහුණු වැඩසටහන් 15 ක් පැවැත්වීම හා එම දිස්ත්‍රික්කයන්හි 2020 සහ 2021 දී පිහිටුවන ලද අපනයන කලාපවල ප්‍රතිලාභීන් සඳහා අඹ අතු කප්පාදු උපකරණ 1,000 ක් ද, මැණික්හාමි, අඩියාපුලියන්කුලම, කන්දකාඩු යන යුධ හමුදා ගොවිපලවල ස්ථාපිත අඹ වගාවන් සඳහා කප්පාදු උපකරණ 150 ක්ද, තන්තිරිමලේ රජමහා විහාරවර්ධන සමිතිය මඟින් සිදු කළ අඹ වගාවන් සඳහා කප්පාදු උපකරණ 100 ක් ද, වශයෙන් ලබාදීම.<br>▪ මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩුවල කුරුඳු සැකසීමේ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ CCTV කැමරා පද්ධති සවිකිරීම.<br>▪ මහනුවර, රත්නපුර, කුරුණෑගල, කෑගල්ල, බදුල්ල, ගම්පහ, මොණරාගල, කොළඹ යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 63 ක් ආවරණය කරමින් ව්‍යවසායකයින් 217 ක් සඳහා ව්‍යාපෘති වාර්තා යොමු කරන ලද අතර, ඒ අතරින් තෝරාගත් ව්‍යවසායකයින් 100ක් සඳහා මී මැසි පෙට්ටි 500ක් ලබාදීම. |


| | | | |
|---|---|---|---|
| | | | ▪ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නිර්දේශ සහිතව හම්බන්තොට, මඩකලපුව, වව්නියාව, මුලතිව්, මොණරාගල, පොළොන්නරුව, කිලිනොච්චිය, මන්නාරම, යාපනය, ගම්පහ, කුරුණෑගල, යන දිස්ත්‍රික්ක ආවරණය කරමින් ඉදිරිපත් කළ කජු කලාප 19ක් සඳහා කජු පැළ 69,732 ක් ලබාදීම.<br>▪ මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 104 ක් සඳහා රට පුවක් පැළ 4000 ක් ලබාදීම.<br>▪ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 1,500 ක් සඳහා රට පුවක් පැළ 7,000 ක් ද ගම්මිරිස් පැළ 6,734 ක් සහ එනසාල් පැළ 7,000 ක් ලබාදීම.<br>▪ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 568 ක් සඳහා ගම්මිරිස් පැළ 5,680 ක් ලබාදීම.<br>▪ මහනුවර දිස්ත්‍රික්කයේ හසලක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 300 ක් සඳහා ගම්මිරිස් පැළ 4,000 ක් ලබාදීම. |
| සහතිකකරණය, ප්‍රතීතනය, ප්‍රමිතිකරණය, පුහුණුව හා කුඩා වැවිලි බෝග ආශ්‍රිත කර්මාන්ත ව්‍යවසාය ප්‍රවර්ධනය<br>(2023) | 2.90 | 2.1222 | ▪ පුහුණු වැඩසටහන් 23 ක් මඟින් කුරුඳු පිරිසැකසුම් ශිල්පීන් 618ක් පුහුණු කිරීම. |
| **ක්‍රියාත්මක අංශය - සුළු අපනයන භෝග ප්‍රවර්ධන අංශය** | | | |
| අධ්‍යාපනය, දැනුවත් කිරීම, වෙළෙඳපොළ සම්බන්ධීකරණය හා වෙළෙඳපොළ බුද්ධි තොරතුරු (Marketing Intelligence)<br>(2023) | 0.70 | 0.494 | ▪ GI ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් දේශීය අපනයන කෘෂි බෝග 02 ක් (ගම්මිරිස්, අන්නාසි) සඳහා GI සහතිකය ලබාගැනීමේ සහ නිලධාරීන් සවිබලගැන්වීමේ වැඩමුළු 04 ක් පවත්වා ඇත.<br>▪ වාඩිය ගුවන් විදුලි වැඩසටහන යටතේ පෙබරවාරි මස ගුවන්විදුලි වැඩසටහන් දෙකක් පැවැත්වීම. |
| අපනයන කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම<br>(2023) | 1.00 | 0.531 | ▪ අමා ව්‍යාපෘතිය යටතේ 2023.09.27 දින තිරසාර කජු කර්මාන්තයක් සඳහා මාර්ග සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගත් වැඩමුළුව පවත්වන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | | ▪ ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි ක්ෂේත්‍රය සඳහා ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ මාර්ග සිතියමක් සකස් කිරීම සඳහා කුරුඳු කර්මාන්ත අගයදාමයේ සියළු පාර්ශව නියෝජනය කරමින් වැඩමුළුවක් ජාතික කුරුඳු පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ දී ද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියළු පර්යේෂණ හා සංවර්ධන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් යුතුව වැඩමුළුවක් මාතලේ පිහිටි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේදී ද අමාත්‍යාංශ නිලධාරීන්ගේ හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් අමාත්‍යාංශයේ දී ද පවත්වන ලදී.<br>▪ සුළු අපනයන බෝග මත පදනම් වූ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 500 දෙනෙකුගේ තොරතුරු රැස්කොට ඇත. කාර්මික සංවර්ධන ආයතනය හා කර්මාන්ත අමාත්‍යාංශය මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගෙන ඇත. කර්මාන්තකරුවන්ගේ දත්ත පද්ධතිය සකස් කරමින් පවතී.<br>▪ අපනයන ක්‍රියාපටිපාටිය, අපනයන විභවතා, TIIP E-marketing යන කරුණු ආවරණය වන පරිදි ඵලදායීතා දියුණු කිරීමේ වැඩසටහන් 06 ක් පවත්වා ඇත.<br>▪ 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීමට කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලදී.<br>▪ කෘෂි භෝග සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා අදාළ සහතිකකරණයන් හා ප්‍රමිතීන් පිළිබඳ දැනට සිදුවන භාවිතයේ සහ පවතින ක්‍රියාපටිපාටින්හි ඇති ගැටළු පිළිබඳ සාකච්ඡාවක් 2023-07-19 දින පවත්වන ලදී.<br>▪ SGS ආයතනයේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් සුළු අපනයන භෝග සහ වැවිලි භෝග ආශ්‍රිත නිෂ්පාදන සඳහා අදාළ සහතිකකරණ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතනයන්හි නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2023.11.03 දින පවත්වන ලදී. |

| | | | |
|---|---|---|---|
| තෝරාගත් දිස්ත්‍රික්කයන්හි අපනයනය ප්‍රමුඛ කරගත් අපනයන කෘෂි (බෝග අගයදාම සංවර්ධන වැඩසටහන - Value Chain (2023) | 6.83 | 5.445 | ▪ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක ප්‍රතිලාභීන් 432 ක් සඳහා කුරුඳු පැළ 29,728 ක් ගම්මිරිස් පැළ 6,881 ක් හා පුවක් පැළ 5,060 ක් ලබාදීම.<br>▪ රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක ප්‍රතිලාභීන් 659 ක් සඳහා වැනිලා දඬු 35,106 ක් ලබාදීම. පුහුණු වැඩසටහන් 11 ක් පැවැත්වීම.<br>▪ මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 74 ක් සඳහා කුරුඳු පැළ 29,600 ක් ලබාදීම<br>▪ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 141 ක් සඳහා කුරුඳු පැළ 17,100 ක් ගම්මිරිස් පැළ 12,920 ක් හා බුලත් පැළ 2,000 ක් ලබාදීම. පුහුණු වැඩසටහන් 05 ක් පැවැත්වීම.<br>▪ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 250 ක් සඳහා ඇරබිකා කෝපි පැළ 6,000 ක් සාදික්කා පැළ 750 ක් ලබාදීම.<br>▪ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 536 ක් සඳහා රට පුවක් පැළ 3,153 ක් ලබාදීම.<br>▪ මහනුවර දිස්ත්‍රික්කයේ පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 890 ක් සඳහා කෝපි පැළ 3,000 ක්, පුවක් පැළ 3,600 ක්, ගම්මිරිස් පැළ 1,500 ක් සාදික්කා පැළ 400 ක් ලබාදීම. |

**වැවිලි ක්ෂේත්‍රය ව්‍යාපෘති (පොදු)**

| ව්‍යාපෘතිය | අනුමත ප්‍රතිපාදන (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| වැවිලි ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම | 1.00 | 0.53 | ▪ ආංශික වැඩමුළු 12ක් පැවැත්වීම |
| යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP) ව්‍යාපෘතිය | 0.413 | 0.413 | ▪ තේ ක්ෂේත්‍රය පිළිබඳ යහපත් කෘෂිකාර්මික පුරුදු GAP සහතිකකරණය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු 2ක් පැවැත්වීම |



..............................................

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී /
ගණන්දීමේ නිලධාරී / ආයතන ප්‍රධානී

ජනක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
11 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.

# 03. පරිච්ඡේදය

## 3.සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒසීඒ-එෆ්

(රු.)

| අයවැය 2023 | | සටහන | තත්‍ය 2023 | තත්‍ය 2022 | |
|---|---|---|---|---|---|
| 2,203,318,183 | **ආදායම් ලැබීම්** | | 1,880,763,681 | 1,216,494,535 | |
| | ආදායම් බදු | 1 | | - | ඒසීඒ-1 |
| | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | - | ඒසීඒ-1 |
| | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | | - | ඒසීඒ-1 |
| 2,203,318,183 | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 1,880,763,681 | 1,216,494,535 | ඒසීඒ-1 |
| **2,203,318,183** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | 1,880,763,681 | 1,216,494,535 | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 1,571,488,199 | 2,199,552,000 | ඒසීඒ- 3 |
| | තැන්පතු | | 12,097.976 | 29,608,456 | ඒසීඒ- 4 |
| 20,000,000 | අත්තිකාරම් ගිණුම් | | 34,853,818 | 28,289,725 | ඒසීඒ- 5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් | | | | |
| 20,000,000 | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,618,439,993** | **2,257,450,181** | |
| 2,223,318,183 | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)** | | **3,499,203,674** | **3,473,944,716** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | | | |
| 2,223,318,183 | **ශු.ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)** | | **3,499,203,674** | **3,473,944,716** | |
| | අඩු කළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | | | |
| 603,743,000 | වැටුප් ,වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 512,550,258 | 423,256,041 | ඒසීඒ-2(11) |
| 489,500,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 362,449,987 | 357,682,919 | ඒසීඒ-2(11) |
| 3,283,700,000 | සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 3,001,731,396 | 2,825,074,205 | ඒසීඒ-2(11) |
| | පොළී ගෙවීම් | 8 | | | ඒසීඒ-2(11) |
| 57,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 56,769 | 34,636 | ඒසීඒ-2(11) |
| **4,377,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **3,876,788,411** | **3,606,047,801** | |
| | **මූලධන වියදම්** | | | | ඒසීඒ-2(11) |
| 38,220,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 20,713,785 | 25,578,281 | ඒසීඒ-2(11) |
| 7,400,000 | මූලධන වත්කම් අත්පත් කරගැනීම | 11 | 696,744 | 900,000 | ඒසීඒ-2(11) |
| 7,398,200,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 4,524,116,369 | 3,971,136,098 | ඒසීඒ-2(11) |
| | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | 13 | | | ඒසීඒ-2(11) |
| 3,500,000 | හැකියා වර්ධනය | 14 | 3,135,044 | 2,806,819 | ඒසීඒ-2(11) |
| 580,274,000 | වෙනත් මූලධන වියදම් | 15 | 520,849,325 | 2,825,379,331 | ඒසීඒ-2(11) |
| 8,027,594,000 | **මුළු මූලධන වියදම් ( උ)** | | **5,069,511,267** | **6,825,800,529** | |
| | තැන්පතු ගෙවීම් | | 13,848,342 | 31,061,437 | ඒසීඒ-4 |
| 40,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 36,219,779 | 59,134,132 | ඒසීඒ-4 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | | |
| | **ප්‍රධාන ලෙජර වියදම් (ඌ)** | | **50,068.121** | **90,195,569** | |
| **12,444,594,000** | **මුළු වියදම එ = (ඊ+උ+ඌ)** | | **8,996,367,799** | **10,522,043,899** | |
| (10,221,275,817) | **දෙසැම්බර් 31 ශේෂය ඒ = (ඉ - එ)** | | **(5,497,164,125)** | **(7,048,099,183)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය ඌ = (ඈ-උ)** | | (5,497,164,125) | (7,048,099,183) | ඒසීඒ- 7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ- 3 |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

**( රු.)**

| විස්තරය | සටහන | තත්‍ය | |
|---|---|---|---|
| | | **2023 වර්ෂය** | **2022 වර්ෂය** |
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | ඒසීඒ - 6 | 907,458,584 | 913,210,677 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ - 5/5 (ඒ) | 70,349,589 | 68,983,628 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ - 3 | - | - |
| **මුළු වත්කම්** | | **<u>977,808,173</u>** | **<u>982,194,305</u>** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 62,366,264 | 59,249,937 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 907,458,584 | 913,210,677 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ - 5 (බී)** | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ - 4 | 7,983,325 | 9,733,691 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ - 3 | - | - |
| **මුළු වගකීම්** | | **<u>977,808,173</u>** | **<u>982,194,305</u>** |

පිටු අංක ..38.... සිට ..39.. දක්වා ඒසීඒ ...1... සිට ඒසීඒ ..7..... දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..40... සිට ..42..දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙහි මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ භාවිතා ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..................................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
11 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.

..................................
ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :

..................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මූල්‍ය)
කොමසාරිස් (මූල්‍ය)
නම :
තනතුර :
දිනය :

පී. වික්‍රමසිංහ
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
8 වන මහල, සෙත්සිරිපාය II වන අදියර
බත්තරමුල්ල

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

### 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ඒසීඒ-සී**

**( රු.)**

| විස්තරය | තත්‍ය | |
|---|---|---|
| | **2023** | **2022** |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 89,048,713 | 26,062,685 |
| අග්‍රිම ලැබීම් | 1,571,488,199 | 2,199,552,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 26,042,199 | 21,016,369 |
| තැන්පතු ලැබීම් | 12,097,976 | 9,591,913 |
| **ප්‍රවාහය (අ)** | **1,698,677,087** | **2,256,222,967** |
| <u>අඩුකළා - මුදල් වැය කිරීම් :</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 852,456,382 | 547,635,412 |
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | 45,329,441 | 2,317,955 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 37,556,713 | 61,476,823 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 35,903,135 | 58,814,849 |
| තැන්පතු ගෙවීම් | 13,848,342 | 14,295,536 |
| මුදල් ප්‍රවාහය (ආ) | **985,094,014** | **684,540,575** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) -(ආ)** | **713,583,074** | **1,571,682,392** |
| පොලී | **-** | **-** |
| ලාභාංශ | **-** | **-** |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | **-** | **-** |
| උපණය අයකර ගැනීම් | **-** | **-** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **<u>අඩු කලා - මුදල් වැයකිරීම් :</u>** | | |
| මූලධන වියදම් | 713,583,074 | 1,571,682,392- |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **713,583,074** | **1,571,682,392** |
| **මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) - (ඉ)** | **(713,583,074)** | **(1,571,682,392)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඈ)+(ඊ)** | **-** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහයන්</u> | - | - |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | |
| **<u>අඩුකලා - මුදල් වැය කිරීම්</u>** | - | - |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) + (ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

| සටහන | වියදම | 135-01-01 | 135-01-02 | 135-02-03 | 135-02-04 | එකතුව |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | |
| 5 | වැටුප්, වේතන හා අනෙකුත් ප්‍රතිලාභ | 21,496,888 | 491,053,371 | - | - | 512,550,259 |
| 6 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 40,367,757 | 322,082,230 | - | - | 362,449,987 |
| 7 | සහනාධාර, ප්‍රදාන හා සේවා | - | 45,329,441 | - | 2,956,401,955 | 3,001,731,396 |
| 8 | පොලී ගෙවීම් | - | - | - | - | - |
| 9 | වෙනත් පුනරාවර්තන වියදම් | - | 56,769 | - | - | 56,769 |
| මුළු පුනරාවර්තන වියදම් (ඇ) | | 61,864,645 | 858,521,811 | - | 2,956,401,955 | 3,876,788,411 |
| මූලධන වියදම් | | | | | | |
| 10 | මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 5,394,504 | 15,319,281 | - | - | 20,713,785 |
| 11 | මූලධන වත්කම් අත්පත් කරගැනීම | - | 696,744 | - | - | 696,744 |
| 12 | ප්‍රාග්ධන මාරු කිරීම් | - | - | 3,137,174,536 | 1,386,941,833 | 4,524,116,369 |
| 13 | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | - | - | - | - | - |
| 14 | හැකියා වර්ධනය | - | 3,135,044 | - | - | 3,135,044 |
| 15 | වෙනත් මූලධන වියදම් | - | - | 503,729,398 | 17,119,927 | 520,849,325 |
| **මුළු මූලධන වියදම් (ඉ)** | | **5,394,504** | **19,151,069** | **3,640,903,933** | **4,360,463,715** | **5,069,511,267** |

## 3.5 ආදායම් එකතුකිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව (රු.මිලි) | | එකතු කරන ලද ආදායම (රු.මිලි) | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.02.01.04 | ප්‍රාදේශීය වැවිලි සමාගම් වලින් ලැබෙන කල් බදු කුලී | 1341.46 | 2203.318 | 1828.083 | 82.97 |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 4,377,000,000 | 4,377,000,000 | 3,876,788,411 | 88.57 |
| ප්‍රාග්ධන | 7,592,000,000 | 8,027,594,000 | 5,069,511,267 | 63.15 |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 1. | කුරුඳු සංවර්ධන දෙපාර්ත මේන්තුව | | 50,245,000 | 50,245,000 | 35,515,942 | 71 |
| 2. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | 651,578 | 651,578 | 651,578 | 100 |
| 3. | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | | 1,389,194 | 1,389,194 | 1,389,194 | 100 |
| | එකතුව | | **52,285,772** | **52,285,772** | **37,556,713** | |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | **2023.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය | **2023.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 125,046,566 | 125,046,566 | | 100 |
| 9153 | ඉඩම් | - | - | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 1,034,960 | 1,034,960 | | 100 |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | |

### 3. 9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

* මෙම වාර්තාව කාර්යසාධන වාර්තාව අවසානයේ අමුණා ඇත

# 04. පරිච්ඡේදය

## 4.කාර්යසාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| 01. | විගණන හා කළමනාකරණ රැස්වීම් වර්ෂය අවසන් වන විට පැවැත්වීම (රැස්වීම් 04) | √ | | |
| 02. | අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම (අමාත්‍ය මණ්ඩල සංදේශ 07) | √ | | |
| 03. | ඉඩම් පැවරීමට අදාළ අයදුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම (අයදුම්පත් 800ක් ) | | √ | |
| 04. | වර්ෂය තුළ පවත්වන ලද කාර්යමණ්ඩල රැස්වීම් සංඛ්‍යාව (රැස්වීම් 04) | | √ | |
| 05. | වර්ෂය තුළ අවසන් කරන ලද පෞද්ගලික ලිපිගොනු සංඛ්‍යාව (පෞද්ගලික ලිපිගොනු 766 ) | √ | | |
| 06. | වාර්ෂික කාර්සාධන ඇගයුම්පත්‍ර වර්ෂය තුළ අවසන් කිරීම (කාර්යසාධන ඇගයුම් පත්‍ර 766) | | | √ |
| 07. | කාර්යමණ්ඩල ලේඛනය යාවත්කාලීන කිරීම (වසරකට අවස්ථා 04 ) | √ | | |
| 08. | නිවාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම (වසරකට අවස්ථා 05) | √ | | |
| 09. | වර්ෂය තුළ සකසන ලද අග්‍රහාර හිමිකම් සංඛ්‍යාව (අග්‍රහාර හිමිකම් 159 ) | √ | | |
| 10. | අමාත්‍යාංශයට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණවල ප්‍රගතිය සමාලෝචනය කිරීම (ප්‍රගති සමාලෝචන වාර්තා 26 ) | √ | | |
| 11. | අමාත්‍යාංශ විෂය පථයට අදාළ කටයුතු පිළිබඳ තොරතුරු සකස් කිරීම සහ ඒවා ජනමාධ්‍ය / අවශ්‍ය පාර්ශව වෙත නිකුත් කිරීම (වසරකට අවස්ථා 12) | √ | | |
| 12. | කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (පුහුණු වැඩසටහන් 08) | | √ | |

| | | | | |
|---|---|---|---|---|
| 13. | අමාත්‍යාංශයේ වෙබ් අඩවිය නිතිපතා සැලසුම් කිරීම, යාවත්කාලීන කිරීම (වර්ෂයකට අවස්ථා 25) | √ | | |
| 14. | වර්ෂය තුළදී තැපැල් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කරන ලද ලිපි සංඛ්‍යාව (ලිපි 3,600 ) | √ | | |
| 15. | වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම (වැඩමුළු 07ක් ) | √ | | |
| 16. | උක් පර්යේෂණ ආයතනය සහ පොල් පර්යේෂණ ආයතනය යන ආයතනවල බුද්ධිමය දේපළ හා ප්‍රතිපත්ති සකස් කිරීම හා ආයතනික ව්‍යාපාරික සැබැඳියාව සකස්කර 2023 දී අවසන් කිරීම | | √ | |
| 17. | වැවිලි ක්ෂේත්‍රයේ බල ශක්ති අවශ්‍යතාවය සැපිරීම සඳහා ජෛව ස්කන්ධ බල ශක්ති සැලසුමක් සකස්කර 2023 වර්ෂයේදි නිම කිරීම | | √ | |
| 18. | ශ්‍රී ලංකාවේ ස්ත්‍රී /පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සඳහා වැවිලි ක්ෂේත්‍රයේ සැලැස්මක් 2023 දී සැකසීම | √ | | |
| 19. | අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණ සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීම (සාකච්ඡා හා වැඩමුළු 10ක් ) | | | √ |
| 20. | පර්යේෂණ ආයතන විසින් විදේශ ආයතන සමඟ එළඹීමට නියමිත අවබෝධතා ගිවිසුම් සැකසීම (අවබෝධතා ගිවිසුම් 03) | | | √ |
| 21. | මහා භාණ්ඩාගාරයට 2023 වර්ෂය තුළ ලබාදිය යුතු මූල්‍ය වාර්තා (මූල්‍ය වාර්තා 32) | √ | | |
| 22. | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (ප්‍රගති සමාලෝචන රැස්වීම් 04) | √ | | |
| 23. | වර්ෂය තුළ අනුමත කරන ලද ක්‍රියාත්මක සැලැස්ම් (ක්‍රියාත්මක සැලැස්ම් 25) | √ | | |

# 05. පරිච්ඡේදය

## 5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% -74% | 75%- 100% |
| 2 | 2.4: 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරීවන්නා වූ කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්වයන් නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | තේ ක්ෂේත්‍රයේ ඵලදායී කෘෂිකාර්මික ක්ෂේත්‍ර ව්‍යාපෘති සාර්ථක කරගැනීමේ අනුපාතය | | √ | |
| | | සිටුවන ලද රබර් නව වගා/ නැවත වගා හෙක්ටයාර ප්‍රමාණය (2023)<br>නව වගා (කුඩා වතු) - හෙක්.436.43<br>නැවත වගා (කුඩා වතු)- හෙක්.324.18<br>නැවත වගා (වැවිලි සමාගම්) - හෙක්.855.58 | | | √ |
| | | නිෂ්පාදනය කරන ලද ගුණාත්මකභාවයෙන් ඉහළ රබර් පැළ සංඛ්‍යාව (2023)<br>රබර් පැළ නිකුත් කිරීම - පැළ 598,708 | | | √ |
| | | සාපේක්ෂ ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් සහතික කරන පොල් නව වගාව, නැවත පැළ සිටුවීම, පාළු පැළ සිටුවීම මඟින් හෙක්ටයාරයකට පැළ නිෂ්පාදනය ඉහළ නැංවීමට ක්‍රියාත්මක කරන ලද පැළ තවාන් සංඛ්‍යාව | | | √ |
| | | 2025 වන විට, ජාතික දළ දේශීය නිෂ්පාදිතය සඳහා අපනයන කෘෂි ක්ෂේත්‍රයේ දැනට පවතින 2% දායකත්වය 4% දක්වා වර්ධනය කිරීම. | | √ | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 1.1: 2030. වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25 ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ | 2025 වන විට අපනයන කෘෂි ව්‍යවසායකයින්ගේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් 6,500 දක්වා වැඩි කිරීම. | | √ | |
| 8 | 8.2: විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදතයක් ලබා ගැනීම. | තේ ක්ෂේත්‍රයේ වගාකරුවන්ගේ කාර්යසාධනය හා නිෂ්පාදන ගුණත්වය ක්‍රියාත්මක කිරිමේ අනුපාතය. | √ | | |
| | | පොල් ආශ්‍රිත අගය එකතු කරන ලද නව නිෂ්පාදන සංඛ්‍යාව. | | √ | |
| | | කෘෂි අපනයන ක්ෂේත්‍රයේ දැනට පවතින 12%ක තරුණ ව්‍යවසායකත්ව දායකත්වය 2025 දී 30% දක්වා වැඩි කිරීම. | | √ | |
| 9 | 9.4: 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරිම සඳහා නව තාක්ෂණය මඟින් සංවර්ධනය කිරීම. කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම, පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගී කරගැනීමට සියලුම රටවල් ඔවුන්ට පවත්නා ධාරිතාවන් අනුව මේ සම්බන්ධයෙන් පියවර ගැනීම. | තේ වගාවේ පාරිසරික තිරසාරභාවය සඳහා ගුණාත්මක බවින් ඉහළ බලශක්ති ප්‍රභව හඳුන්වාදෙන ලද තේ කර්මාන්තශාලා සංඛ්‍යාව. | | √ | |
| | | පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා හඳුනාගත් නව තාක්ෂණ පර්යේෂණ සංඛ්‍යාව | | √ | |
| | | නවීකරණය කරන ලද පොල් තෙල් මෝල් සංඛ්‍යාව | √ | | |
| 12 | 12.3: 2030 වන විට සිල්ලර සහ පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි සිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම. | 2025 වන විට, ජාතික දළ දේශීය නිෂ්පාදිතය සඳහා අපනයන කෘෂි ක්ෂේත්‍රයේ දැනට පවතින 2% දායකත්වය 4% දක්වා වර්ධනය කිරීම. | | √ | |
| 17 | 17.11: අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් ලෝක අපනයනයට සපයන කොටස 2020 වන විට දෙගුණ කිරීමේ දැක්මකින් යුක්තව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සැළකිය යුතු මටටමකින් වර්ධනය කිරීම. | ශ්‍රී ලාංකීය නිමි තේ ගෝලීය අපනයන කොටස ඉහළ යයි නම් අපනයනය කළ කිලෝග්‍රෑම් ප්‍රමාණය | | √ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ**

- ආර්ථික අර්බුද මත දේශීය ආර්ථිකයේ මතු ව තිබූ දැඩි අර්බුදකාරී තත්ත්ව තුළ හා වෙනත් ක්ෂේත්‍ර සමඟ පැවති ගැටලුකාරී තත්ත්ව තුළ වුව ද , සැලකිය යුතු ප්‍රගතියක් කරා යාමට හැකිවීම.
- දැනට ජාතික වශයෙන් ප්‍රකාශයට පත්ව ඇති තිරසාර සංවර්ධන ඉලක්ක හා දර්ශකයන්ට අනුව සෘජුව වැවිලි ක්ෂේත්‍රයට අදාළ ඉලක්ක හා දර්ශක නොමැති වුවද වක්‍රකාරව සලකා බැලිය හැකි වැවිලි ක්ෂේත්‍රයේ උප දර්ශක ප්‍රමාණයක් ගොඩනගා ගැනීමට හැකිවීම.

**ඉලක්ක සපුරාගැනීමේ අභියෝග**

- ජාතික වශයෙන් දායකත්වය සැපයිය හැකි යාවත්කාලීන කළ හැකි අමාත්‍යාංශයීය විෂයපථයට අදාළ දත්ත සහිත ඉලක්ක හා දර්ශක නිශ්චය කිරීමේ අපහසුව.
- අමාත්‍යාංශයීය විෂයපථයන් කෙටිකාලීනව වෙනස් වූ හෙයින් ඉලක්ක නිගමනය කර ඒ සඳහා වූ ස්ථිර දර්ශක ගොඩනගා ගැනීමේ අපහසුව.
- වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්වුව ද, අදාළ ව්‍යාපෘති සඳහා අක්මුදල් ලබා ගැනීමේ ගැටළු මෙන්ම වාර්ෂිකව අනුමත වන ව්‍යාපෘති සංඛ්‍යාව සීමා වීම තුළ දර්ශක සාක්ෂාත් කරගැනීමේ අපහසුව.
- ගෝලීය ආර්ථික අර්බුදය හා ඉන්ධන අර්බුදය හා දේශීය ආර්ථිකයෙන් මතු වූ ඉන්ධන හා පොහොර සැපයීමේ ගැටළු හේතුවෙන් අපනයන ප්‍රවර්ධනයට බාධාවන් ඇති වී තිබීම.
- විධිමත් වගාවක් ලෙස ස්ථාපිත වී නොමැති සාම්ප්‍රදායික කර්මාන්තයක් වශයෙන් පවතින කිතුල් හා තල් වගාවන් ආශ්‍රිත දත්ත නොමැතිකම සහ මෙම වගාවන් විසිරුණු හෝ කුඩා පරිමාණයේ සාම්ප්‍රදායික ගෘහ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වී ඇති බැවින් මධ්‍යම හෝ මහා පරිමාණයෙන් සංවර්ධනය කිරීමට යාන්ත්‍රීකරණය / තාක්ෂණය යොදා ගැනීමට අපහසු වීම.
- කෘෂිකාර්මික ශ්‍රම බලකාය සීඝ්‍රයෙන් අඩු වීම හා තරුණ ශ්‍රමිකයන් සීඝ්‍රයෙන් සේවා අංශ වෙත යොමු වීම හේතුවෙන් වැවිලි ක්ෂේත්‍රයන්ගේ තිරසර සංවර්ධනයක් පවත්වාගෙන යැමට බාධා ඇති වීම.

# 06. පරිච්ඡේදය

## 6. මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| සේවක ගණය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 54 | 45 | 09 |
| තෘතීයික | 05 | 03 | 02 |
| ද්විතීයික | 694 | 691 | 03 |
| ප්‍රාථමික | 80 | 60 | 20 |
| එකතුව | 833 | 799 | 34 |

### 6.2 මානව සම්පත් හිඟය හා අතිරික්තය බලපානු ලබන ආකාරය

ඇතැම් තනතුරුවල පුරප්පාඩු පැවතීම හේතුවෙන් ආයතනයේ අපේක්ෂිත ප්‍රතිඵල හා නිමැවුම් ලබා ගැනීමට අසීරු වී ඇත. සමස්තයක් ලෙස පවත්නා කාර්ය මණ්ඩලයේ කළමනාකරණය මඟින් අපේක්ෂිත අරමුණු කරා සාධනීය ලෙස ළඟා වී ඇත.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසට හනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු. 000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ගීත විචාරාත්මක රසවින්දන වැඩසටහන | 300 | පැය 4 | 88,557.25 | | දේශීය | ගුණාත්මක රාජ්‍ය සේවක පිරිසක් බිහි කිරීම සඳහා සමස්ත කාර්යමණ්ඩලය සඳහා සුවදායී මනසක් නිර්මාණය කිරීම. |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම සඳහා දෙමළ භාෂා පාඨමාලාව | 91 | පැය 150 | 112,500.00 | | දේශීය | රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම තුළින් රාජ්‍ය සේවයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කරලීම. |
| අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම | 5 | දින 01 | 30,000.00 | | දේශීය | කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ විෂය දැනුම වර්ධනය සඳහා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Executive MSc in Finance (පෙර වර්ෂයක සිදු කරන ලද ශාස්ත්‍රපති උපාධියකට අදාළ ගෙවීමකි) | 1 | වසර 01 | 170,000.00 | | දේශීය | ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවට අනුව ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් සම්පූර්ණ කළයුතු ශාස්ත්‍රපති උපාධිය මඟින් විෂය දැනුම පිළිබඳ දායකත්වය අමාත්‍යාංශය වෙත ලබා ගැනීම. |
| ඉඩම් අයිතිය පැවරීමේ නීතිය | 3 | පැය 2.30 | 3,000.00 | | දේශීය | නීති අංශයේ නිලධාරීන්ගේ විෂය දැනුම වර්ධනය සඳහා |
| විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම | 6 | දින 01 | 30,000.00 | | දේශීය | රියදුරු මහතුන්ගේ දැනුම හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ අවබෝධය ලබාදීම. |
| රජයේ නව බදු ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 1 | දින 01 | 6,500.00 | | දේශීය | රජයේ නව බදු ප්‍රතිපත්තිය පිළිබඳ නිලධාරීන්ගේ දැනුම වර්ධනය. |

# 07. පරිච්ඡේදය

## 7. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූලතා නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | - | - |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන තිබීම | | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | 2023 වර්ෂයේ වැඩි වාර්තා ප්‍රමාණයක් යවා ඇති අතර ඉතිරි කිහිපය ජනවාරි මස යැවීමට කටයුතු කරනු ලැබේ. | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | පැවති රාජ්‍ය අමාත්‍යාංශ හා අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ආයතන සතුව පැවති වාහන කීපයක් හඳුනාගෙන ඇති අතර මුල් කාර්තුව තුළ දී ඒවා අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | මු.රෙ. 104 අනුව පැවති රාජ්‍ය අමාත්‍යාංශ | - |

| | | | | |
|---|---|---|---|---|
| | | | වල පරීක්ෂණ 2 ක් හා වැවිලි අමාත්‍යාංශයේ එක් පරීක්ෂණයක් පවත්වා ඇත. | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල නොවේ. | ඉන්ධන අර්බුදය හේතුවෙන් 2023 වර්ෂයේ එක් වරක්වත් ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම සිදු කර නැත. | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ. | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(I) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූලවීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| **13** | **පොදු තැන්පතු ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයන් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩල<br>ය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ. | වාර්ෂික කාර්ය සාධන වාර්තා අනුව ඇගයීම් සිදු කරනු ලැබේ | |
| 19.4 | ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ.<br>ජ්‍යෙ.නිළධාරි යෙකු පත් කර ඇත. | - | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

# ඇමුණුම

# இணைப்பு

# Annexure

මගේ අංකය / எனது இல. / My No. } පීඒඑල්/ඊ/එම්ඒපීඅයි/02/23/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 28 දින

වැවිලි කර්මාන්ත
28 MAY 2024
4.12 P.M
ගිණුම් අංශය

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

**ශීර්ෂය 135- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**දේපළ පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක PC – 6259 දරන වාහනයේ පිරිවැය වූ රු. 6,090,000ක් ස්ථාවර වත්කම් ලේඛණයේ දෙවරක් සටහන් වී තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ දේපළ පිරියත උපකරණ එම අගයෙන් අධිගණනය වී තිබුණි.

(ආ) අංක CAT-4686 දරන මෝටර් රථය ගත් මිල රු.40,414,358ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනයේ රු.40,500,000ක් ලෙස රු.85,642ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි.

(ඇ) අමාත්‍යාංශය මගින් කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය වෙත පරිහරණය සඳහා පමණක් ලබා දී තිබුණු අංක CAQ-1757 දරන මෝටර් රථයේ සහ අංක PA-4062 දරන කැබ් රථයේ වටිනාකම් අමාත්‍යාංශ වාහන ලේඛනයට ඇතුළත්ව නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් වෙනත් ආයතන වෙත පවරා දුන් වාහන පිළිබඳ විස්තරයේ ද එම වාහන දෙක ඇතුළත් කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මෝටර් වාහන වටිනාකම රු. 12,800,000කින් අවප්‍රමාණය වී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් රැස් කිරීම්

(අ) 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 10කින් රජයට අයවිය යුතු රු.587,146,771ක බදු ආදායම හිඟව පැවතියද , මු.රෙ.176(2) ප්‍රකාරව භාණ්ඩාගාරය හා එක්ව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ නොවැම්බර් 27 දින කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන කල් බදුකුලී සංශෝධිත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය මත ගණනය කළ බදු මුදල වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතු වුවද ශුද්ධ වත්කම් අඩුවීම මත සමාගම විසින් වසරකට ගෙවිය යුතු බදු මුදල අඩුවෙන් ගෙවීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට රු.326,507,724 ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු අතර එයින් රු.168,290,244 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවත තිබුණු බව නිරීක්ෂණය විය. මෙම සමාගම සමඟ ඇති කර ගෙන තිබුණු කල් බදු සංශෝධන ගිවිසුමෙහි 2(a) සහ 5(c) ඡේද අනුව ද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 පෙබරවාරි 15 දින අංක PE/PL/RP/Gen/2017 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැවිලි අමාත්‍යාංශ ලේකම් වෙත වැවිලි සමාගම් විසින් රජයේ ඉඩම් උප බදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20 ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට කාර්තුමය පදනමින් අය කිරීමට නියම කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.39,068,269කින් සමාලෝචිත වර්ෂයේදී රු.19,145,371ක් පමණක් ලැබී තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟහිටි උප බදු මුදල රු.19,922,898ක් විය. 2023 වර්ෂය සඳහා වැවිලි සමාගම් 10කින් උප බදු කිසිවක් අයවී නොතිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා

මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර ඇති බවට ගණන්දීමේ නිලධාරී වගබලා ගත යුතු අතර, එම ඇස්තමේන්තු පදනම්කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමකට අනුව නිසි වැඩපිළිවෙලක් යටතේ වියදම් කළ යුතු වුවත් පහත දැක්වෙන කරුණු හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය .

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදනයන් පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 මගින් වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන සියයට 33 සිට සියයට 305දක්වා ප්‍රතිශතයකින් මාරු කර තිබීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,500,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 21 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.292,500,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.127,014,153 ක් හෙවත් සියයට 29 සිට සියයට 97 දක්වා ඉතිරි වී තිබීම.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.5,900,000 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර ප්‍රාග්ධන වැය විෂයයන් 07ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 4,074,120,000ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.2,751,915,094ක් හෙවත් සියයට 21 සිට සියයට 91 දක්වා ඉතිරි වී තිබීම.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා මු .රෙ.66 යටතේ මාරුකර තිබුණු එකතුව රු.2,000,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු1,568,080ක් අදාල කාර්යයන්හි උපයෝජනය නොකර නිශ්කාර්යව පැවතීම.

## 2.3 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| **නීති රීති රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් භාවිතා කරන වාහන 55ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 3. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම

(අ) අමාත්‍යාංශයෙන් බැහැරට ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.36,116ක ණය ශේෂයක් අවුරුදු 28 කට වැඩි කාලයක සිට අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) වැඩ තහනම් කර ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් වසර 14 සිට 26 දක්වා කාලයක සිට අයවිය යුතු එකතුව රු.398,511ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

2023 ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය පහත පරිදි විය.

(අ) උතුරු පොල් ත්‍රිකෝණයේ පොල් පැළ බෙදා හැරීමේ ව්‍යාපෘතියට අදාළ ඉඩම් තෝරා ගැනීම,පොල් පැල බෙදාහැරීම හා පොල් පැල රෝපණය සඳහා රු.මිලියන 9.5ක් වෙන්කර තිබුණු අතර එම සම්පූර්ණ මුදලම වැය කර තිබුණද ඉඩම් තෝරාගැනීමේ භෞතික ප්‍රගතිය සියයට 44ක් වී තිබුණි. එසේම පොල් පැල රෝපණයේ ප්‍රගතියද සියයට 67 ක් වී තිබුණි.

(ආ) වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය කළමනාකරණය කිරීමේ කාර්යය යටතේ ආසාධිත පොල් පැළ හඳුනාගැනීම හා තෝරාගත් පැළ එන්නත් කිරීම යන කාර්යයන්හි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 47ක් හා සියයට 60ක් වී තිබුණි.

### 4.2 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභ හානි සිදු වී වර්ෂ 01 ත් වර්ෂ 12 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 06 ක් සම්බන්ධයෙන් එකතුව රු. 5,221,961 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලය 833ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 772 ක් වූ බැවින් පුරප්පාඩු 61ක් පැවතියද එම අනුමත පුරප්පාඩු කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

වී.ඩී. සීතා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**Ministry of Agriculture and Plantation Industries**
**Plantation Industries Division**
**11th Floor, Sethsiripaya Stage II,**
**Battaramulla**